# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1767/26 - 2012 ජූලි 19 වැනි බ්‍රහස්පතින්දා - 2012.07.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උෟව පළාතේ පළාත් සභාව

උෟව පළාතේ පළාත් සභාවේ 1989 අංක 01 දරන උෟව පළාතේ, හදිසි අවස්ථා අරමුදල් ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උෟව පළාතේ, පළාත් සභාව විසින් සම්මත කරන ලදුව 1989 ජූලි මස 11 වැනි දින සිට උෟව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති මෙම ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැන ගැනීම සඳහා මෙහි පළ කරමි.

ඩබ්ලිව්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා,
ලේකම්,
උෟව පළාතේ පළාත් සභාව.

2012 ක් වූ ජූලි මස 05 වැනි දින,
බදුල්ල, රජවීදියේ පිහිටි
උෟව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**උෟව පළාතේ 1989 අංක 1 දරන හදිසි අවස්ථා අරමුදල**
(1989.07.11 වැනි දින අනුමත කරන ලදී)

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(1) වගන්තිය යටතේ හදිසි අවස්ථා අරමුදලක් පිහිටුවීම පිණිස ද ඊට සම්බන්ධ සහ අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උෟව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

නාමය

1. මේ ප්‍රඥප්තිය 1989 අංක 1 දරන හදිසි අවස්ථා අරමුදල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

උෟව පළාතේ හදිසි අවස්ථා අරමුදල

2. 1. උෟව පළාතේ අනපේක්ෂිත වියදම් දැරීමේ අරමුණින් (මෙහි මින් මතු 'අරමුදල' යනුවෙන් සඳහන් කරනු ලබන) හදිසි අවස්ථා අරමුදලක් මෙයින් ඇති කරනු ලැබේ.

   2. රුපියල් දසලක්ෂ දෙකක (2) මුදලක් පළාත් අරමුදලෙන් මෙම අරමුදලට බැර කළ යුතු අතර එම මුදල අරමුදලේ කොටසක් විය යුතුය.

   3. පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රඥප්ති මඟින් කලින් කලට තීරණය කෙරෙන සියළු මුදල් මෙම අරමුදලට බැර කළ යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අත්තිකාරම් මුදල් ගෙවීම

3. අරමුදලෙන් අත්තිකාරම් ගෙවීමේ දී 1978 අංක 42 දරන පළාත් සභා පනතේ 20(2) උප වගන්තියේ දැක්වෙන විධිවිධාන, අනුගමනය කළ යුතු ය.

භාරකාරිත්වය දැරීම

4. අරමුදලේ භාරකාරිත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතු අතර ඉන් කෙරෙන සියළු අත්තිකාරම් ගෙවීම් ඔහු අතින් සිදු විය යුතු ය.

08-122/1

---

## ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාතේ, පළාත් සභාවේ 1990 අංක 02 දරන ඌව පළාතේ, පළාත් සභාවේ (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් සම්මත කරන ලදුව 1990 අප්‍රේල් මස 20 වැනි දින සිට ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති මෙම ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැන ගැනීම සඳහා මෙහි පළ කරමි.

ඩබ්ලිව්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා,<br>ලේකම්,<br>ඌව පළාතේ, පළාත් සභාව.

2012 ක් වූ ජූලි මස 05 වැනි දින,<br>බදුල්ල, රජවීදිය,<br>ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**1990 අංක 02 දරන පළාත් සභා**<br>**(වැටුප් හා දීමනා ගෙවීමේ) පනත**

ඌව පළාතේ, පළාත් සභාවේ, සභාපතිවරයාට ද, නියෝජ්‍ය සභාපති වරයාට ද ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය

1. මෙම ප්‍රඥප්තිය, 1990 අංක 02 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවිය යුතු වැටුප් හා දීමනා

2. මෙම ප්‍රඥප්තිය අනුමත කරනු ලැබූ දින සිට සහ ඉන් පසුව ගෙවිය යුතු මාසික වැටුප් හා අනෙකුත් සියලුම දීමනා :-

(අ) පළාත් සභාවේ සභාපතිවරයාට, පළාත් සභාවේ අමාත්‍යවරයෙකුට දැනට ගෙවනු ලබන මාසික වැටුප් හා අනෙකුත් සියලුම දීමනා හා සමාන මාසික වැටුප් සහ අනෙකුත් සියලු දීමනා ; සහ

(ආ) පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයාට, රේඛීය අමාත්‍යාංශයක නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට, දැනට ගෙවනු ලබන මාසික වැටුප් සහ අනෙකුත් සියලු දීමනාවලින් සියයට පනහකට සමාන මාසික වැටුප් සහ දීමනා

වැටුප් සහ දීමනා පළාතක පළාත් සභා අරමුදලට වැය බරක් වන වියදමක් විය යුතු බව

3. පළාත් සභාවේ, සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපතිවරයාට මෙම ප්‍රඥප්තිය යටතේ ගෙවිය යුතු වැටුප් සහ දීමනා, ඒ පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන වියදමක් වන්නේ ය.

08 - 122/2

## ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාතේ, පළාත් සභාවේ 1993 අංක 02 දරන ඌව පළාතේ, ප්‍රධාන අමාත්‍ය අරමුදල් ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළතේ, පළාත් සභාව විසින් සම්මත කරන ලදුව 1993 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති මෙම ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැන ගැනීම සඳහා මෙහි පළ කරමි.

ඩබ්ලිව්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා,<br>
ලේකම්,<br>
ඌව පළාතේ, පළාත් සභාව.

2012 ක් වූ ජුලි මස 05 වැනි දින,<br>
බදුල්ල, රජවීදිය,<br>
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**දුගී භාවයට සහන සැලසීම, අධ්‍යාපනය හෝ දැනීම නංවාලීම, ආගම නංවාලීම, පළාත සඳහා සේවය කළ තැනැත්තන්ට තෑගි ප්‍රදානය කිරීම සහ පළාතේ ජනතාවගේ යහපත හෝ අභිවෘද්ධිය සළස්වාලන වෙනත් කාර්යය සඳහා "ප්‍රධාන අමාත්‍ය අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි**

ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ ප්‍රඥප්තිය 1993 අංක 2 දරන ප්‍රධාන අමාත්‍ය අරමුදල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන "ප්‍රධාන අමාත්‍ය අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අරමුදල, ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, අවිච්ඡින්න පැවැත්මක් ඊට ඇත්තේ ය. තවද ඒ සඳහා පොදු මුද්‍රාවක් තබා ගැනීම කළ හැකි අතර, එකී සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකිය.

3. (1) අරමුදලේ පරිපාලනය, කළමණාකරනය සහ ප්‍රාග්ධනය මෙහි මින් මතු විධිවිධාන සළස්වා ඇති පරිදි සංස්ථාපනය කරනු ලබන පාලක මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලේ පාලක මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත යුතු ය.

(අ) පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා,

(ආ) පළාත් ආණ්ඩුකාරවරයා නම් කරන තැනැත්තෙකු,

(ඇ) විරුද්ධ පක්ෂය විසින් නම් කරනු ලැබූ හෝ විරුද්ධ පක්ෂය නියෝජනය කරන්නා වූ ද, ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු වූද පළාත් සභා මන්ත්‍රීවරයක්,

(ඈ) පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් වර්ෂ තුනක් නොඉක්මවන කාලයකට පත් කරනු ලබන වෙනත් තැනැත්තන් දෙදෙනෙක්.

(3) (2) වැනි උප වගන්තියේ (ඈ) වැනි ඡේදය යටතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබූ යම් සාමාජිකයෙකුගේ පත්කිරීම, එම උප වගන්තියේ (ඈ) ඡේදයේ විධිවිධාන ගැන නොතකා ප්‍රධාන අමාත්‍යවයා විසින් ඉවත් කරනු ලැබිය හැකිය.

(4) මණ්ඩලයේ රැස්වීම් වලදී එම රැස්වීම පැවැත්විය යුතු ආකාරය හා කළ යුතු කරුණු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්යය පරිපාටිය විධමත් කරනු ලබනු ඇත.

(5) මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීම හේතු කොට ගෙන හෝ මණ්ඩලයේ සාමාජිකයෙකු- පත් කිරීමේ යම් දෝෂයක් තිබීම හේතු කොටගෙනම මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කාර්යය පරිපාටියක් අවලංගු වන්නේ යයි නොසැළකිය යුතු ය.

(6) ප්‍රධාන අමාත්‍යවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

4. අරමුදල පරිපාලනය කිරීමෙන් සහ අරමුදල නාමයෙන් පහත දැක්වෙන බලතල මණ්ඩලය සතු වේ.

(අ) චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීම, දැරීම හෝ කළමණාකරණය කිරීම ;

(ආ) මණ්ඩලයට හිමිකම් ලැබෙන චංචල හෝ නිශ්චල යම් දේපළක් විකිණීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම හෝ ඒ සම්බන්ධ කටයුතු කිරීම ;

(ඇ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු කිරීම සඳහා.

5. ආධාර මුදල්, පරිත්‍යාග හෝ ත්‍යාග වශයෙන් අරමුදලට ලැබෙන සියලු මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

6. "ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ගිණුම" යනුවෙන් සඳන් කරනු ලබන ගිණුමක් මණ්ඩලය විසින් පිළිගනු ලැබූ බැංකුවක පවත්වා ගෙන යා යුතු අතර, මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසු අරමුදලට උපචිත වන සියලු මුදල් ඒ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

7. මණ්ඩලය විසින් මණ්ඩලය සතු අරමුදල් යෙදවීමෙන් ;

(අ) දුගී භාවයට සහන සැළසීම හෝ ;

(ආ) අධ්‍යාපනය හෝ දැනීම නංවාලීම හෝ ;

(ඇ) ආගම නංවාලීම හෝ ආගමික වතාවත් සහ පරිචයන් නංවාලීම හෝ කළ හැකිය.

8. අරමුදලට අයත් මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට ආයෝජනය කරනු ලැබිය හැකිය.

9. පහත දැක්වෙන බලතල මණ්ඩලය සතු වේ-

(අ) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමණාකරණය කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම ;

(ආ) එසේ පත් කරනු ලැබූ නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම ;

(ඇ) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම සඳහා දරණු ලැබූ පාරිශ්‍රමික සහ වෙනත් වියදම් අරමුදලේ ආදායමින් ගෙවීම.

10. (1) අරමුදලේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමටත් වාර්ෂික ගිණුම් පිළියෙල කරවීමටත් මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගිණුම් වර්ෂයක් පාසා විගණනය කළ යුතු ය. එකී ගිණුම් විගණනය කිරීමේදී තමාට සහායවීම සඳහා යම් සුදුසුකම් ලත් විගණකාධිවරයෙකුගේ, සේවය විගණකාධිපතිවරයා විසින් ලබාගනු ලැබිය හැකි අතර, එවැනි විගණකවරයෙකු විගණකාධිපතිවරයාගේ මෙහෙයුම් සහ පාලනය යටතේ කටයුතු කළ යුතු ය. එවැනි විගණනයක ප්‍රතිඵල අඩංගු වාර්තාවක් විගණකාධිපතිවරයා විසින් පළාත් ආණ්ඩුකාරවරයා වෙත සැපයිය යුතු අතර, පළාත් ආණ්ඩුකාරවරයා විසින් ඒ වාර්තාව පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) අරමුදලේ ගිණුම් විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් දරනු ලැබූ වියදම් පියවීම පිණිස මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික අරමුදලේ ආදායමින් විගණකාධිපතිවරයා වෙත ගෙවනු ලැබිය යුතු ය. අරමුදලෙන් විගණකාධිපතිවරයා වෙත ලැබුණු යම් පාරිශ්‍රමිකයකින් එකී විගණනය සඳහා ඔහු විසින් සේවයේ යොදවනු ලැබූ සුදුසුකම් ලත් යම් විගණකවරයෙකුට හෝ විගණකවරුනට ඔහු විසින්ම ගෙවනු ලැබූ මුදල් අඩු කිරීමෙන් පසු ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයෙකු " යනු යෙදුමෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනෙත් යම් ආයතනයක සාමාජිකයෙකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තන් හෝ ;

(ආ) එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයෙක් වන්නා වූ ද, ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයෙන් සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූ ද, නේවාසික හවුල් කරුවන්ගෙන් සමන්විත වරලත් ගණකාධිකාරීවරුන් සාමගමක් අදහස් වේ.

11. මණ්ඩලයේ බලතල, කාර්යය සහ කර්තව්‍ය සිදුකිරීම සහ ඉටු කිරීම කෙරෙහි බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කවර වුවද කාරණයක් සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සළකනු ලබන රීති, ඒ ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකිය.

08-122/3

---

## ඌව පළාතේ, පළාත් සභාවේ 2000 අංක 05 දරන ඌව පළාතේ, පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී රජරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් සම්මත කරන ලදුව 2003 ඔක්තෝබර් මස 10 වැනි දින සිට ඌව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම සඳහා මෙහි පළ කරමි.

ඩබ්ලිව්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා,
ලේකම්,
ඌව පළාතේ, පළාත් සභාව.

2012 ක් වූ ජූලි මස 05 වැනි දින,
බදුල්ල, රජවීදියේ පිහිටි
ඌව පළාතේ සභා ලේකම් කාර්යාලයේ දී ය.

### ඌව පළාත් සභාවේ 2000 අංක 05 දරන ඌව පළාතේ පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තිය

### ඌව පළාතේ පුස්තකාල ප්‍රඥප්තිය

1. *ලුහුඬු නාමය*.- මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ 2000 අංක 05 දරන ඌව පළාතේ පුස්තකාල සේවා මණ්ඩලය ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්වේ.

2. *හැඳින්වීම.-* ඌව පළාත තුළ පුස්තකාල සේවාව විධිමත්ව පවත්වාගෙන යාම සඳහාත්, ඒ මගින් පාඨක අවශ්‍යතා සපුරාලීම සඳහාත් ඌව පළාතේ පුස්තකාලවල සියලුම සංවර්ධන හා අධ්‍යාපනික කාර්යයන් සඳහා අවශ්‍ය සියලුම දැනුම, අවබෝධය, දත්ත හා තොරතුරු යාවත්කාලීන හා විධිමත් ලෙස සලසා දීම සඳහාත්, ඊට අදාළව අවශ්‍යවන්නා වූ සේවාවන්, උපකරණ, ගොඩනැගිලි හා පොත් පත් සැපයීම් කටයුතු හා කාර්යය පවත්වාගෙන යාමට අදාළ කටයුතු විධිමත්ව හා ඒකීයභාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහාත්, පුස්තකාල සේවාවන්ට අදාළ සේවාවන්හි නියුක්ත වන්නා වූ සේවක කාණ්ඩ බඳවා ගැනීම, සේවා වගකීම් හා විනය පරිපාලනයට අදාළ කරුණු පිළිබඳව අවශ්‍ය විධිවිධාන සැලසීම සඳහාත්, සේවක කාණ්ඩවල අවශ්‍ය වෘත්තීය දැනුම හා පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහාත්, ඉහත සියලු කාර්යයන්ට අනුරූපව යෝග්‍ය ආයතනික ව්‍යූහය ගොඩනැගීම සඳහා වූ ප්‍රඥප්තියකි.

3. *අරමුණු*

(අ) ඌව පළාතේ පුස්තකාල හා තොරතුරු සේවා සම්බන්ධීකරණය හා සංවර්ධනය කිරීම ;

(ආ) පොත්පත් හා ලේඛන සංරක්ෂණය කිරීම ;

(ඇ) ප්‍රලේඛන සේවා සංවිධානය කිරීම හා පළාතේ ලේඛන කලාව හා ග්‍රන්ථකරණය සම්බන්ධව උනන්දුවක් දක්වන ලේඛකයින්ගේ ග්‍රන්ථ ප්‍රකාශන කටයුතුවලට සහාය වීම ;

(ඈ) කියවීමේ ද්‍රව්‍ය උපකරණ සුලභ කිරීම, ප්‍රදර්ශන/සම්මන්ත්‍රණ හා ව්‍යාපෘති කටයුතු පවත්වාගෙන යාම ;

(ඉ) අධ්‍යාපනික හා අවබෝධාත්මක වැඩසටහන් පවත්වාගෙන යාම ;

(ඊ) පළාතේ පුස්තකාලවල පුස්තකාලයාධිපතීන් හා පුස්තකාල කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ, උසස් කරලීමේ පරිපාටීන් සකස් කිරීම සහ විභාග හා පරීක්ෂණ පැවැත්වීම ;

(උ) පුස්තකාල සංවර්ධන අරමුදල පිහිටුවීම හා එකී කටයුතු පවත්වාගෙන යාම ;

(ඌ) පළාත් තුළ සියලුම ආකාරයේ (පෞද්ගලික නොවන) පුස්තකාල සේවාවන් විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු සම්බන්ධීකරණ කාර්යයන් සඳහා අවශ්‍ය විධිවිධාන පැනවීම ;

(එ) පුස්තකාල සඳහා අවශ්‍ය පොත්පත්, උපකරණ සැපයීම හා ඒ සඳහා අවශ්‍ය විධිමත් සැලසුම් සැකසීම හා නියම කිරීම ;

(ඔ) ජාතික හා අන්තර්ජාතික දැනුම හා තොරතුරු තාක්ෂණයේ නව ප්‍රවනතාවයන් හා බද්ධවෙමින් ඌව පළාත තුළ තොරතුරු තාක්ෂණය හා දැනුම ප්‍රවර්ධනය කිරීම ;

(ඕ) මූලික පරමාර්ථයන්ට හා ක්‍රියාකාරකම්වලට අනුකූල වන්නා වූ කාර්යයන් පවත්වාගෙන යාමට අවශ්‍ය, වෙනත් විවිධ ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන්නා වූ අතුරු ව්‍යවස්ථා සහ අදාළ අනෙකුත් ව්‍යවස්ථා, නීති රීති සම්පාදනය කිරීම හා නියෝග සැකසීම.

4. *ව්‍යුහය*

මෙම ප්‍රඥප්තියෙන් දක්වා ඇති කාර්යයන් සඳහා මෙහි මතු දැක්වෙන විධිවිධානවලට අනුකූලව පහත සඳහන් ආයතන/ඒකක පිහිටුවනු ලැබේ.

1. පළාත් පුස්තකාල සේවා මණ්ඩලයක් සහ ස්ථිර කාර්ය මණ්ඩලයකින් යුතු පරිපාලන ඒකකයක්

2. පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට අනුබද්ධිත පළාත් මධ්‍ය පුස්තකාලයක් (ඌව පළාත් පුස්තකාලය)

3. මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල දෙකක්

*1 වැනි කොටස*

5. *ඌව පළාත් පුස්තකාල සේවා උපදේශක මණ්ඩල හා උපදේශක කමිටු පිහිටුවීම :*

(අ) ඌව පළාතේ පුස්තකාල සේවා මණ්ඩලයට අවශ්‍යවන අවස්ථාවල දී උපදෙස් ලබාදීම උදෙසා පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුත් මණ්ඩලයක් පත් කරනු ලබන්නේ ය. පළාත් පුස්තකාල සේවා උපදේශක මණ්ඩලය

1. ඌව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පළාත් සභාවේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ;
2. ඌව පළාත් සභාවේ විපක්ෂ නායකවරයා විසින් පත් කරනු ලබන පළාත් සභාවේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ;
3. ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්.

(ඇ) පළාත් පුස්තකාල මණ්ඩලය මගින් ඉටු කරනු ලබන පුස්තකාල හා තොරතුරු සේවා වෘත්තිය කටයුතු සඳහා මණ්ඩලයට උපදෙස් ලබා දීමට ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විත උපදේශක කමිටු විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පත් කළ යුතු ය.

6. *ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය සහ අනු මණ්ඩල පිහිටුවීම :*

(අ) ඌව පළාතේ පුස්තකාල සේවාවන් පිළිබඳව කටයුතු සැලසුම්කරණය, සංවර්ධනය, සම්බන්ධීකරණය හා පළාත තුළ සියලු පුස්තකාල සේවා කටයුතුවල ඒකීයභාවයක් පවත්වාගෙන යාම සහ පළාත් පුස්තකාල සේවා මණ්ඩලය යටතේ පිහිටවනු ලබන මණ්ඩල, අනු මණ්ඩල, ඒකක හා වෙනත් ආයතනවල පරිපාලනය පවත්වාගෙන යෑම පිණිසත්, ඌව පළාතේ පුස්තකාල සේවා මණ්ඩලය නමින් යුතු ආයතනයක් පිහිටුවනු ලබන අතර, එය මින් මතු මෙම ප්‍රඥප්තියේ විධිවිධාන සඳහා 'මණ්ඩලය' යන කෙටි නාමයෙන් හඳුන්වනු ලබන්නේ ය. පළාත් පුස්තකාල සේවා මණ්ඩලය

එකී මණ්ඩලය,

(I) ඌව පළාත් සභාවේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා පහත සඳහන් සාමාජිකයන්ගේ සමන්විත විය යුතු වන්නේ ය.

(අ) අධ්‍යාපන විෂයයභාර අමාත්‍යාංශයේ ලේකම්,
(ආ) පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්,
(ඇ) පළාත් පාලන කොමසාරිස්,
(ඈ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
(ඉ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් හෝ නියෝජිතයෙක්,
(ඊ) විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පළාතේ පුස්තකාල කටයුතු සම්බන්ධව උනන්දුවක් දක්වන විද්වතුන් දෙදෙනෙකු,
(උ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්),
(ඌ) පළාතේ විශ්ව විද්‍යාල පුස්තකාලයාධිවරයෙක්,
(එ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකයෙකු.

(II) පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ඒ මණ්ඩලයේ ලේකම් වශයෙන් ද ක්‍රියා කළ යුතු අතර, ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු නොවනු ඇත. මණ්ඩලයේ සියලු ලිපි ලේඛන, වාර්තා සහ පරිපාලන කටයුතු භාරව ඔහු ක්‍රියා කළ යුතු වන්නේ ය.

7. 1. මෙම ප්‍රඥප්තිය යටතේ පවරනු ලබන වගකීම් සහ කාර්යයන් යථා පරිදි ඉටුකිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයේ නිර්දේශය සහිතව සකස් කරන ලද බඳවා ගැනීමේ පරිපාටියකට අනුව අවශ්‍ය අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, පරිපාලනමය කුසලතාව හා පළපුරුද්දක් ඇති අයෙකු පළාත් පුස්තකාල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කළ යුතු වන්නේ ය. පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ සහ වෙනත් නිලධාරීන් පත් කිරීම

2. මෙම ප්‍රඥප්තිය යටතේ පවරනු ලබන වගකීම් සහ කාර්යයන් ඉටු කිරීම සඳහා කලින් කලට අවශ්‍ය විය හැකි නිලධාරීන් සහ සේවක මණ්ඩල පළාත් පුස්තකාල සේවා මණ්ඩලය මගින් පත් කරනු ලැබිය හැකි ය.

3. මෙම වගන්තියේ (1) සහ (2) යන උපවගන්ති යටතේ පත් කරනු ලබන සියලුම නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

4. මෙම ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කරන යම් රාජ්‍ය නිලධරයෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් කාර්යයක් සම්බන්ධනේ ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

5. මෙම වගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂකරවාය විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ තම වගකීම් හා කාර්යයන් ඉටු කිරීමේ දී පළාත් පුස්තකාල සේවා මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ විධිවිධානවලට හා තීරණවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

6. මෙම වගන්තිය යටතේ පත් කරනු ලබන වෙනත් සියලු නිලධරයන් ඉහත (5) උප වගන්තියට අනුකූලව අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ විධාන යටතේ තම වගකීම් හා කර්තව්‍යයන් ඉටු කළ යුතු වන්නේ ය.

7. අධ්‍යක්ෂවරයා ඇතුළු සියලු කාර්යය මණ්ඩල සඳහා අදාළ බඳවා ගැනීම් පරිපාටින් සහ සේවක පාරිශ්‍රමික සේවා කොන්දේසි ආදිය ප්‍රඥප්තියේ විශේෂයෙන් සඳහන් කර නොමැති විට අමාත්‍යවරයාගේ ද අනුදැනුම ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලබනවා ඇත.

මණ්ඩලයේ වගකීම් හා කාර්යභාරය සඳහා නියෝග හා රීති

8. 1. මණ්ඩලයේ වගකීම් හා කාර්යභාරය සහ ඊට අදාළ කර්තව්‍යන් වෙනුවෙන් මෙම ප්‍රඥප්තියේ විධිවිධිනවලට යටත්ව අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි වන්නේ ය.

2. මණ්ඩලයේ රැස්වීම්වලට කාර්යය පරිපාටික සහ එම රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහාත් කමිටු දීමනා, රැස්වීම් දීමනා ගෙවීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් එකී රීති සාදනු ලැබිය හැක්කේ ය.

දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල අනු මණ්ඩල පිහිටුවීම

9. 1. ඌව පළාතේ ඒ ඒ දිස්ත්‍රික්කවල පුස්තකාල සේවා සහ තොරතුරු සේවා ක්‍රමවත් කිරීමට, සංවර්ධනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ද, එම කටයුතු පාලනය කිරීමට ද, අදාළ වන කරුණු සම්බන්ධයෙන් පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ උපදෙස් හා නිර්දේශයන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහාත් එම කරුණු සම්බන්ධයෙන් පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට අවශ්‍ය වූ විට තොරතුරු හෝ නිර්ක්ෂණ ලබ ගැනීම සඳහාත් දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල අනු මණ්ඩලය පිහිටවනු ලැබිය හැකිය.

2. මෙම දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල අනු මණ්ඩලය මෙහි මින්මතු දිස්ත්‍රික් අනු මණ්ඩල වශයෙන් හඳුන්වනු ලබන අතර, එම මණ්ඩල පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු වන්නේ ය :

(i) අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිකයෙක් ;
(ii) අදාළ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පුස්තකාල සේවා අනු මණ්ඩල සභාපතිවරු ;
(iii) දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස් ;
(iv) පළාත් පුස්තකාල සේවා මණ්ඩලය විසින් පත් කරනු ලබන නියෝජිතයෙක් ;
(v) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ දිස්ත්‍රික්ක සඳහා නම් කරනු ලබන නියෝජිතයෙක් ;
(vi) අදාළ දිස්ත්‍රික්කයේ පුස්තකාල අධීක්ෂණ කටයුතු පැවරී ඇති, පළාත් පාලන කොමසාරිස් විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;
(vii) විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, පාඨක සේවාවන්ට අදාළ තොරතුරු තාක්ෂණය, විඥාපනය හා නූතන දැනුම පිළිබඳව හසල දැනුමක් හා අවබෝධයක් ඇති අදාළ දිස්ත්‍රික්කයේ විද්වතුන් දෙදෙනෙක් ;
(viii) දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරී.

3. ඉහත මණ්ඩලයේ නිලධාරීන්ගෙන් කෙනෙකු සභාපති වශයෙන් සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තෝරාගනු ලබන අතර, එහි නිල බලයෙන්ම දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාලයේ පුස්තකාලයාධිපති ලේකම්වරයා වශයෙන් කටයුතු කරන අතර, ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන්නේ ය.

ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාල අනු මණ්ඩල පිහිටුවීම

10. 1. ඌව පළාතේ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පුස්තකාල සේවා සහ තොරතුරු සේවා ක්‍රමවත්ව කිරීමට, සංවර්ධනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ද එම කටයුතු පාලනය කිරීමට ද, අදාළ වන කරුණු සම්න්ධයෙන් පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ උපදෙස් හා නිර්දේශයන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහාත් එම කරුණු සම්බන්ධයෙන් පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට

අවශ්‍ය වූ විට තොරතුරු හෝ නිරීක්ෂණ ලබා ගැනීම සඳහාත් දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල අනු මණ්ඩලයට සම්බන්ධිත ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාල අනු මණ්ඩලයක් පිහිටවනු ලැබිය හැකි ය.

2. මෙම ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාල අනු මණ්ඩලය මෙහි මින් මතු ප්‍රාදේශීය අනු මණ්ඩල වශයෙන් හඳුන්වනු ලබන අතර, එම මණ්ඩල පහත සඳහන් සාමාජිකයන් ගෙන සමන්විත විය යුතු වන්නේ ය.

(i) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;
(ii) අදාළ පළාත් පාලන ආයතනයේ හෝ පළාත් පාලන ආයතනවල සභාපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;
(iii) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අයත් වන අදාළ අධ්‍යාපන කලාපයේ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;
(iv) පළාත් පාලන කොමසාරිස්ගේ හෝ සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ නියෝජිතයෙක් ;
(v) ප්‍රාදේශීය ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ සංස්කෘතික නිලධාරී ;
(vi) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාජ්‍ය අංශයේ සියලුම පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරු.

3. ඉහත මණ්ඩලයේ නිලධාරීන්ගෙන් කෙනෙකු සභාපති වශයෙන් සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තෝරාගනු ලබන අතර, එහි නිල බලයෙන්ම ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරයා ලේකම්වරයා වන අතර ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු නොවන්නේ ය.

11. අනු මණ්ඩල හා මධ්‍ය පුස්තකාලය ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ උපදෙස්, නීතිරීතිවලට අනුව කටයුතු කළ යුතු ය. *අනු මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය*

12. අනු මණ්ඩලවල ක්‍රියාකාරිත්වය, රැස්වීම් කාර්යය පරිපාටිය සහ එහි දීමනා ආදී කරුණු පිළිබඳව අදාළ වන්නා වූ රීති පළාත් මණ්ඩලය විසින් පනවනු ඇත. *අනු මණ්ඩලයට අදාළ රීති*

13. 1. විෂයභාර අමාත්‍යවරයා විසින් මණ්ඩලයට පත් කරනු ලබන සාමාජිකයන්ගේ ධුර කාලය යම් සාමාජිකයෙක්ගේ මියා යාම, අස්වීම හා කාලය ඉකුත් වීමට පෙර අදාළ පරිදි විෂයභාර අමාත්‍යවරයා හෝ මණ්ඩලය විසින් ඉවත් කරනු ලැබීම වැනි හේතූන් මත ධුරය හිස් වුවහොත් මිස දෑ අවුරුදු කාල සීමාවක් සඳහා බල පවත්නේ ය. *මණ්ඩලය හා අනු මණ්ඩල සඳහා පත් කරන සාමාජිකයින්ගේ ධුර කාලය*

2. මණ්ඩලයට හෝ අනු මණ්ඩලයට පත් කරන ලද යම් සාමාජිකයෙකු අදාළ පරිදි විෂයභාර අමාත්‍යවරයා හෝ මණ්ඩලය විසින් ඕනෑම අවස්ථාවක හේතුවක් නොදක්වා ඉවත් කිරීමට බලය ඇත්තේ ය.

3. නියමිත ධුර කාලය ඉකුත් වීමට පෙර, සාමාජිකත්වයක් හිස් වූ විට ඒ වෙනුවට පත් කරනු ලබන අය හිස් වූ ධුරය දැරූ අය විසින් ගත නොකළ ඉතිරි කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු වන්නේ ය.

4. කාලය ඉකුත් වීමෙන් පසු හෝ ඉන් පෙර ධුර කාලය අවසන් කළ සාමාජිකයෙකු සාමාජිකත්වය සඳහා ප්‍රඥප්තියේ විධිවිධාන මත නුසුදුස්සෙකු වී නොැමති නම්, නැවත පත් කරනු ලැබීමට ද සුදුසු විය යුතු ය.

5. අසනීප තත්ත්වය නිසා හෝ විදේශගතව සිටීම නිසා හෝ වෙනයම් හේතුවක් මත යම් සාමාජිකයෙකු මණ්ඩලය හෝ අනු මණ්ඩලය වෙනුවෙන් ධුරයේ යුතුකම් ඉටු කරනු ලැබීමට අපොහොසත් වන්නේ නම්, ඔහු වෙනුවෙන් තාවකාලිකව සාමාජිකත්වයේ වැඩ බැලීමට සුදුසු අයෙකු පත් කරනු ලැබීමට අදාළ පරිදි විෂය භාර අමාත්‍යවරයාට හෝ මණ්ඩලයට බලය ඇත්තේ ය.

14. යම් තැනැත්තෙකු,

(1) සාපරාධී වැරැද්දකට වරදකරු වී තුන් මසකට නොඅඩු කාලයක් අත් හටවූ හෝ ක්‍රියාත්මක වූ සිර දඬුවමකට ලක්ව තිබීම හෝ වරදකට රු. 500.00කට වැඩි දඩයකට යටත්ව තිබීම. *සාමාජිකත්වය සඳහා නුසුදුසුකම්*

(2) යම් තැනැත්තෙකු තදබල විෂමාචාර චෝදනා යටතේ විධිමත් ලෙස සේවයෙන් පහ කරන ලද අයෙකු වීම,
(3) පළාත් සභා හෝ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් දැරීම, සාමාජිකත්වය දැරීමට නුසුදුස්සෙකු වන්නේ ය.

සාමාජිකත්වය අහෝසි වීම

15. යම් තැනැත්තෙකු,

(1) මිය යාම,
(2) ඉල්ලා අස්වීම
(3) ඉවත් කරනු ලැබීම,
(4) ප්‍රඥප්තියේ සඳහන් පරිදි සාමාජිකත්වය ලැබීමට අදාළ වූ ධුරය දැරීම අවසන් වීම,
(5) සාපරාධී වරදකට වරදකරු වී තුන් මසකට නොඅඩු සිර දඬුවමක් (අත්හිට වූ හෝ ක්‍රියාත්මක) ලැබීම
(6) සාමාජිකත්වය ලබමින් සිටිය දී පාර්ලිමේන්තු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු වීම,
(7) හේතු නොදක්වා මණ්ඩලයේ/අනු මණ්ඩලයේ රැස්වීම් වාර තුනකට නොපැමිණීම

යන කරුණු මත සාමාජිකත්වය දැරීම අහෝසි වන්නේ ය.

## *II වැනි කොටස*

මුදල්

16. පුස්තකාල අරමුදලක් පිහිටුවීම

ඌව පළාත් සභාව විසින් පුස්තකාල කටයුතු සඳහා වාර්ෂිකව මුදල් ප්‍රතිපාදන වෙන් කරනු ඇත. එම මුදල් මණ්ඩලයේ උපදෙස් අනුව අදාළ අවශ්‍යතාවයන්ට අනුකූලව වාර්ෂිකව ඌව පළාත තුළ පුස්තකාල කටයුතු සඳහා වැය කළ හැකි වේ. මීට අමතරව රජය විසින් ද පුස්තකාල කටයුතු සඳහා අවශ්‍ය විශේෂ ප්‍රතිපාදන සලසා දිය හැකිය. එසේම විදේශාධාර සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ද අරමුදල් ලබා ගත හැකිය.

පළාත් පුස්තකාල අරමුදල

17. 1. ඌව පළාත් තුළ පුස්තකාල සේවා හා තොරතුරු සේවා නගා සිටුවීම, සංවර්ධනය කිරිම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා මෙහි මින් මතු 'අරමුදල' යනුවෙන් හඳුන්වන්නා වූ ඌව පළාතේ පුස්තකාල අරමුදලක් පිහිටුවනු ලබනවා ඇත.

2. ඌව පළාත් පුස්තකාල මණ්ඩලය සඳහා පිළිගත් රාජ්‍ය බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යා යුතු ය.

අරමුදලට ගෙවනු ලබන මුදල්

18. පහත සඳහන් මූල්‍ය ලැබීම් සියල්ල මෙම ගිණුමට බැර කළ යුතු ය.

(අ) රජය විසින් පුස්තකාල කටයුතු සඳහා වෙන් කරනු ලබන මුදල්,
(ආ) පළාත් සභා විසින් වාර්ෂිකව හෝ විශේෂ අවශ්‍යතා මත වෙන් කර දෙනු ලබන මුදල්,
(ඇ) විදේශීය වශයෙන් හෝ දේශීය වශයෙන් හෝ ආධාර වශයෙන් හෝ ප්‍රදානයන් වශයෙන් ලැබෙන මුදල්.

චංචල හා නිශ්චල දේපළ මිලදී ගැනීම හෝ පරිත්‍යාග ලෙස ලබා ගැනීම හා විකිණීම

19. 1. මණ්ඩලය වෙනුවෙන් යම් චංචල හෝ නිශ්චල දේපලක් නියමිත පරිදි මිල දී ගැනීමට ද පරිත්‍යාග වශයෙන් ලබා ගැනීමට ද අවකාශ ඇත්තේ ය.

2. එසේ ලබා ගන්නා යම් චංචල හෝ නිශ්චල දේපළක් නියත කාර්යයට අනුකූලව විකිණීමට ද අවසර ඇති අතර, යම් ඉඩකඩම්, ගොඩනැගිලි හෝ යන්ත්‍ර සූත්‍ර යානවාහනාදිය විකුණනු ලබන විට අමාත්‍යවරයාගේ අනුමැතිය ගත යුතු ය.

3. එසේ විකුණා ලැබෙන සියලු මුදල් අරමුදලට බැර කළ යුතු ය.

අරමුදලේ පරිපාලනය

20. 1. අරමුදල අමාත්‍යවරයාගේ මෙහෙයවීම හා අධීක්ෂණයට යටත්ව මණ්ඩලය විසින් පරිපාලනය කළ යුතු ය.

2. මණ්ඩලය අරමුදල් පාලනය සම්බන්ධව අමාත්‍යවරයා වෙත අවශ්‍ය උපදෙස් දීම හා උපදේශක මණ්ඩලයක් ලෙස ද කටයුතු කරනු ඇත.

3. එක් එක් ලිත් වර්ෂය අවසන් වූ වහාම හැකි ඉක්මණින්, එහෙත් මණ්ඩලය විසින් කැඳවීමක් කර ඇතොත් මිස, තෙමසක් ඉකුත් වීමට මත්තෙන් අරමුදලේ මූල්‍ය පරිපාලනය පිළිබඳව වාර්තාවක් අධ්‍යක්ෂවරයා විසින් පිළියෙල කර, ඌව පළාතේ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් එය අමාත්‍යවරයා වෙත සිය නිර්ක්ෂණ සහ නිර්දේශ සමග ඉදිරිපත් කළ යුත්තේ ය.

4. එක් එක් ලිත් වර්ෂය සම්බන්ධයෙන් පරිපූර්ණ ලෙස හා උචිත ලෙස අරමුදලේ ගිණුම් තබාගෙන යාම අධ්‍යක්ෂවරයාගේ වගකීම වන්නේ ය.

5. අරමුදලේ සියලු ගිණුම් පරිපාලනය පිළිබඳව උචිත විධානයන් නිකුත් කරනු ලැබීමටත්, යම් උපදෙස් හා මග පෙන්වීමේ විධිවිධාන සැලැස්වීමටත් ඌව පළාතේ ප්‍රධාන ලේකම්වරයාට බලයක් හිමි වේ.

6. 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අරමුදලේ මූල්‍ය පාලනය හා ගණන් හිලව් සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

7. අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

21. විෂය භාර අමාත්‍යවරයා විසින් එක් එක් ලිත් වර්ෂය සම්බන්ධයෙන් අරමුදලේ පරිපාලනය පිළිබඳව වාර්තාවක් ඌව පළාත් සභාව හමුවේ තැබිය යුතු ය. එම අරමුදලේ ගිණුම් පිළිබඳව වූ විගණනයට අනුව විගණකාධිපතිවරයාගේ පිටපතක් ද, අමාත්‍යවරයා විසින් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු ය. අරමුදල පිළිබඳව වාර්ෂික වාර්තාවක් පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම

22. අදාළ පරිදි අමාත්‍යවරයාගේ උපදෙස් හා අනුමැතිය සහිතව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයන් මත- අරමුදලෙන් කරනු ලබන ගෙවීම්

(අ) මණ්ඩලයේ සේවක පඩිනඩි හා වෙනත් පාරශ්‍රමිකයන්,

(ආ) සහික සාමාජික හා කමිටු දීමනා, රැස්වීම් දීමනා,

(ඇ) මණ්ඩලය විසින් පවත්වාගෙනු යනු ලබන මධ්‍ය පුස්තකාලවලට අදාළ පරිපාලන වැය,

(ඈ) ප්‍රඥප්තියේ පැනවී ඇති විධිවිධානවලට අනුකූලව දැරිය යුතු සියලු වියදම්,

(ඉ) මණ්ඩලයේ කාර්යයන් හා කර්තව්‍යයන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පනවනු ලබන හා මණ්ඩලයට එරෙහිව පනවනු ලබන නීති කෘත්‍යයක් සඳහා දැරිය යුතු වන සියලු වියදම්,

(ඊ) ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව අමාත්‍යවරයා විසින් හෝ අදාළ පරිදි මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් සියලු ගෙවීම්,

(උ) දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව වෙනුවෙන් දැරිය යුතු වියදම්,

අරමුදලෙන් ගෙවිය හැකිය.

## *III වැනි කොටස*

23. පුස්තකාල හා විඥාපන පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම

අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි පහත සඳහන් කාර්යයන් සඳහා මෙහි මින් මතු පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය වශයෙන් හඳුන්වනු ලබන පුහුණුවීම් හා පර්යේෂණ හෝ සේවා මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් පිහිටුවනු ලැබිය හැකිය.

(අ) පුස්තකාල විද්‍යාව, විඥාපන විද්‍යාව හා දත්ත තොරතුරු සේවා අධ්‍යයන, දැනුම, අවබෝධය, උපදෙස් හා පුහුණුව ලබාදීම සහ එහි ශිෂ්‍යයන් විසින් ලබා ඇති ප්‍රවීණතාවය නිශ්චය කිරීමේ විභාග පරීක්ෂණ පැවැත්වීම හා සහතික ප්‍රදානය ;

(ආ) පුස්තකාල සේවා සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා අවහ්‍ය සේවාවන් හා දත්ත තොරතුරුසැපයීම ;

(ඇ) දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය ;

නියෝග පැනවීම සඳහා අමාත්‍යවරයා සතු බලය

24. අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝගයක් මගින්

1. බඳවා ගැනීමේ පරිපාටි

2. අධ්‍යාපනය පුහුණුව සහ විභාග පිළිබඳ පරිපාටි

3. අවශ්‍ය විය හැකි පරිදි ඒ ඒ ආයතනවලට අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, ගුරුවරුන්, උපදේශකයන් සහ වෙනත් නිලධරයන් පත් කිරීම සහ ඔවුනට වැටුප් ගෙවීම පිළිබඳ පරිපාටි නියම කරනු ලැබිය හැකි ය.

පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය පහසුකම් සැලසීම, විනය පාලනය ආදිය සඳහා අමාත්‍යවරයා සතු බලය

25. අමාත්‍යවරයාට මෙම ප්‍රඥප්තිය යටතේ

1. පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයට අවශ්‍ය පහසුකම් සැපයීම සහ පුහුණුව නේවාසික පහසුකම් සහ වෙනත් කාර්යයන් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම, ඒවා නඩත්තු කිරීම සහ උපකරණ සැපයීම සඳහා ද,

2. ශිෂ්‍යයන්ගේ සහ ආචාර්ය මණ්ඩලයේ විනය සහ සුබ සාධනය ඇති කිරීම සහ විධිමත් කිරීම සඳහා ද,

3. මෙම ආයතන මගින් සහතික පත් ප්‍රදානය කිරීමට විධිවිධාන සැලසීම සඳහා ද බලය තිබිය යුතු ය.

## *IV වැනි කොටස*

### *පුස්තකාල පිහිටුවීම සහ පුස්තකාල සේවා පරිපාලනය*

පුස්තකාල සේවා පරිපාලනය

26. 1 ඌව පළාත් තුළ පුස්තකාල කටයුතු සැලසුම්කරණය සංවර්ධන සම්බන්ධීකරණය යනාදී කටයුතුවල සම්පූර්ණ බලතල මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය සතුවන අතර, එම කාර්යයන් පවත්වාගෙන යාම සඳහා සුදුසු කාර්යාලයක් සහ කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යා හැකිය.

26. 2 මණ්ඩලය විසින් එක් අවශ්‍යතාවයන් සඳහා පිහිටුවනු ලබන මධ්‍ය පුස්පතකාලවල සියලු පරිපාලන කටයුතු ද ඊට අනුබද්ධිත පවත්වාගෙන යා යුතු ය.

පුස්තකාල සේවා පවත්වාගෙන යාම

26. 3 පහත දැක්වෙන පුස්තකාල සේවාවන් පළාත් පුස්තකාල මණ්ඩලය විසින් ඉටු කළ යුතු ය.

(i) පුස්තකාල සංවර්ධනය සඳහා වෘත්තීය උපදෙස් ලබාදීම
(ii) විශේෂ ප්‍රදානයන් සැපයීම
(iii) පුස්තකාලායාධිපතිවරුන් හා සහායක සේවාවන් පත් කිරීමේ සේවා කොන්දේසි හා බඳවා ගැනීමේ කාර්යය පරිපාටි හා උසස්වීම් විධිවිධාන සැකසීම
(iv) පුස්තකාල සහයෝගිතා ක්‍රම ඇති කිරීම
(v) පුස්තකාලයාධිපතින්ට හා සහායක සේවාවන්ට අවශ්‍ය උපදෙස් සැපයීම
(vi) පුස්තකාල සේවාවන්ට අදාළ හෝ විෂයානුගත ප්‍රකාශ පළ කිරීම
(vii) සංඛ්‍යාලේඛන තොරතුරු දත්ත එකරැස් කිරීම
(viii) පර්යේෂණ කිරීම

(ix) පරිවර්තන සංස්කරණ සේවා සැලසීම
(x) පුහුණු පාඨමාලා පැවැත්වීම
(xi) තාක්ෂණික සේවා සැපයීම
(xii) කියවීම් පහසුකම් සැලසීම
(xiii) අධ්‍යාපන පහසුකම් හා ග්‍රන්ථ පරිපාලන පහසුකම් සැපයීම
(xiv) පුස්තකාල නීතිරීති, ව්‍යවස්ථා හා ප්‍රමිති ආදිය සම්පාදනය කිරීම
(xv) වෙනත් පුස්තකාල සංවර්ධන කටයුතු

ආදී සියලු කාර්යයන් සහ කර්තව්‍යයන් මණ්ඩලය විසින් සිය කාර්යය මණ්ඩලයේ ද අනුබද්ධිත මධ්‍ය පුස්තකාල සේවාවන් හි දී සහාය ඇතිව පවත්වාගෙන යනු ලබනවා ඇත.

26. 4 මෙහි දි පළාත් පුස්තකාල සේවා මණ්ඩලය විසින් හෝ මණ්ඩලයේ මෙහෙයවීම සහ උපදෙස් මත-

1. පළාත් මධ්‍ය පුස්තකාලය ;

2. අවශ්‍යතාවයන්ට අනුකූලව තීරණය කරනු ලබන පරිදි දිස්ත්‍රික්ක හෝ කලාපීය මධ්‍ය පුස්තකාල ;

3. ප්‍රාදේශීය මට්ටමෙන් මි පළාත් පාලන ආයතනයකට අනුබද්ධිත වූ ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාලයක් බැගින් ස ; හ

4. පුස්තකාල සේවා උපදේශක මණ්ඩල හා පාඨක සමාජ පවත්වාගෙන යනු ලැබිය හැකිය.

27. 1 පළාත් මධ්‍ය පුස්තකාලය

(අ) ජාතික පුස්තකාලය ජාතික මට්ටමින් ඉටු කරනු ලබන්නා වූ සියලු කාර්යයන් මණ්ඩලයේ පරිපාලනයට යටත්ව පළාත් මට්ටමේ ඉටු කිරීම පළාත් මධ්‍ය පුස්තකාලයෙන් අපේක්ෂා කෙරේ.

(ආ) ඒ අනුව එම පළාත් මධ්‍ය පුස්තකාලය පළාතේ ඇති ප්‍රධාන පුස්තකාලය වේ.

(ඇ) එසේම පළාත තුළ සියලුම පුස්තකාල සේවා සම්බන්ධීකරණය ද මෙම පළාත් මධ්‍ය පුස්තකාලය මගින් ඉටු කරනු ලබනවා ඇත.

27. 2 දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල ඃ

(අ) මණ්ඩලයේ සහ පළාත් මධ්‍ය පුස්තකාලයේ අධීක්ෂණයට හා පරිපාලනයට යටත්ව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි දිස්ත්‍රික්ක මට්ටමේ හෝ පුස්තකාල සේවා විධිමත්ව පවත්වා ගෙන යාමට යෝග්‍ය පරිදි වෙන් කරනු ලබන කලාප මට්ටම්වල දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල පිහිටවනු ලැබිය හැකිය.

(ආ) දිස්ත්‍රික්කයේ හෝ අදාළ පළාත් කොට්ඨාසය තුළ පුස්තකාල සේවා කාර්යයන් සම්බන්ධීකරණය දිස්ත්‍රික් මට්ටමේ සියලු කාර්යයන් හි දී පළාත් මධ්‍ය පුස්තකාලය නියෝජනය කිරීම ද පුස්තකාල සේවාවන් සැපයීම, අන්තර් පුස්තකාල ද්‍රව්‍ය හා ග්‍රන්ථ හුවමාරු සේවා සම්බන්ධීකරණය ද මණ්ඩලය සහ පළාත් මධ්‍ය පුස්තකාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ හඳුන්වා දෙනු ලබන විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් අදාළ කොට්ඨාසය තුළ ක්‍රියාත්මක කිරීම ද දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාල මගින් ඉටු කළ යුතු ය.

(ඇ) අදාළ කොට්ඨාසයේ අනෙකුත් සියලු පුස්තකාලවල මව්පුස්තකාලය ලෙස මෙය ක්‍රියා කළ යුතුයි.

27. 3 ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාලය :

(අ) පුස්තකාල සේවා ප්‍රාදේශීය අනු මණ්ඩල කොට්ඨාසය තුළ පළාත් පාලන ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ යම් පුස්තකාලයක් ප්‍රාදේශීය මධ්‍ය පුස්තකාලයක් වශයෙන් වැඩිදියුණු කරනු ලබනවා ඇත.

(ආ) එහි සෘජු පරිපාලනය මණ්ඩලය වෙත හෝ පළාත් මධ්‍ය පුස්තකාලය වෙත නොපැවරෙන නමුත් මණ්ඩලය හා පළාත් මධ්‍ය පුස්තකාලයේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ එකී කොට්ඨාසය තුළ සියලු පුස්තකාලවල මව්පුස්තකාලය ලෙස එය ක්‍රියාත්මක විය යුතු ය.

(ඇ) මෙය දිස්ත්‍රික් මධ්‍ය පුස්තකාලය සමග සේවා හා පරිපාලනමය නොවූ බැඳීමකින් යුතුව ක්‍රියාත්මක විය යුතු ය.

(ඈ) මධ්‍ය පුස්තකාලයක් හෝ ප්‍රදේශයේ ප්‍රධාන පුස්තකාලයක් ආශ්‍රිතව ඉටු කරනු ලබන අන්තර් පුස්තකාල හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

(ඉ) ප්‍රදේශයක ප්‍රධාන පුස්තකාලය ලෙස ක්‍රියා කරමින් අන්තර් පුස්තකාල පිරුළු සේවාවන් පුස්තකාල පොත්පත් හා ද්‍රව්‍ය හුවමාරුව ආදී සහයෝගිතා කටයුතු ආදී සාමූහික ප්‍රතිග්‍රහණ සහ සංසරණ කටයුතු, සංරක්ෂණ කටයුතු සම්බන්ධීකරණය ද මෙම මූලික පුස්තකාලය මගින් ඉටු කළ යුතු ය.

27. 4 පුස්තකාල සේවා උපදේශක මණ්ඩල හා පාඨක සමාජ :

(අ) මණ්ඩලයේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ මණ්ඩලය විසින් නියම කරනු ලබන යම් විධානයන්ට හා නියමයන්ට අනුකූලව සෑම මධ්‍ය පුස්තකාලයකටම සහ සෑම මහජන පුස්තකාලයකටම අනුබද්ධිතව උපදේශක මණ්ඩල හා පාඨක සමාජ පිහිටුවනු ලැබිය හැකි ය.

මෙම මණ්ඩල හා සමාජවල කාර්යය පරිපාටිය හා අදාළ වෙනත් කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය රීති මණ්ඩලය විසින් නියම කරනු ලබනවා ඇත.

## V වැනි කොටස

28. පොදු විධිවිධාන :

අමාත්‍යවරයා සතුවන සාමාන්‍ය සහ විශේෂ විධිවිධාන

(1) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල, අනු මණ්ඩලවල, කමිටුවල, සංගම්වල හෝ වෙනත් සංවිධානවල බලතල ක්‍රියාවෙහි යෙදවීම කාර්යයන් කිරීම සහ යුතුකම් ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඒ මණ්ඩලය, අනු මණ්ඩලය, කමිටුව, සංගමය හෝ සංවිධාන වෙත, පොදු හෝ විශේෂ ලිඛිත විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ ඒ මණ්ඩලය, අනු මණ්ඩලය, කමිටුව, සංගමය හෝ වෙනත් සංවිධානයක් විසින් ඒ විධාන ක්‍රියාවෙහි යෙදවිය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් සංවිධානවල දේපල කටයුතු සම්බන්ධයෙන් වාර්තා සහ වෙනත් තොරතුරු තමාට අවශ්‍යවිය හැකි ආකාරයෙන් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් මණ්ඩලයට, අනු මණ්ඩලවලට, කමිටුවලට, සංගම්වලට සහ වෙනත් සංවිධානවලට කලින් කල විධාන කළ හැකි අතර ඒ ඒ මණ්ඩල අදාළ වන කමිටු, සංගම් හා වෙනත් සංවිධාන ඒ හැම විධානයක්ම අනුව ක්‍රියාකළ යුතු ය.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද මණ්ඩලවල, අනු මණ්ඩලවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් සංවිධානවන කටයුතු සියල්ලම හෝ ඉන් යමක් තමන් විසින් නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තෙකු හෝ තැනැත්තෙක් විසින් විමර්ශනය කරන ලෙසත් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කළ හැකි අතර එසේ නියම කරනු ලැබූ කල්හි ඒ ඒ සෑම නියමයක්ම ක්‍රියාවේ යෙදවීම සඳහා විය හැකි සියලු පහසුකම් සැලැස්වීම සහ සියලු තොරතුරු සැපයීම ඒ ඒ මණ්ඩලය, අනු මණ්ඩලය කමිටුව, සංගමය සහ වෙනත් සංවිධානයක් විසින් කළ යුතු ය.

29. (1) ඌව පළාත නියෝජනයවීම සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී පුස්තකාලයාධිපතිවරයෙකුට හෝ පුස්තකාලයාධිපති කණ්ඩායමකට සහභාගී කරවීමට සහ එම කාර්ය පාලනය සඳහා අමාත්‍යවරයාට නියෝග සෑදීමට හැකිය. — නියෝග සෑදීමේ බලය

(2) අදාළ ආයතන විසින් සැපයිය යුතු අවම පුස්තකාල පහසුකම් පිළිබඳ නියෝග සහ ප්‍රමිති පැනවීමට අමාත්‍යවරයාට හැකි ය.

(3) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා නියම කරනු ලැබීමට මේ ප්‍රඥප්තියේ නියමිත හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්පතියෙන් බලය දී ඇති සියලු කරුණු සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *රජයේ ගැසට් පත්‍රයේ* පළ කළ යුතු අතර එසේ පළ කරනු ලබන දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් කර තැබිය හැකි මතු දිනයක සිට එය ක්‍රියාත්මක කළ හැකි අතර අමාත්‍යවරයා විසින් *රජයේ ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු ලැබූ යම් නියෝගයක් එකී අනුමත කළ දිනයේ සිට පරිච්න්න වූ ලෙස සැලකිය යුතු නුමුදු ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතු ය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්න්න වූ ලෙස සැලකෙන දිනය *ගැසට් පත්‍රයේ* පළකළ යුතු ය.

30. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සහ මධ්‍ය පුස්තකාලවල සේවකයන්ට හා මණ්ඩල අනු මණ්ඩල සාමාජිකයින්ට මණ්ඩලයේ නිර්දේශ මත සුදුසු පාරිශ්‍රමිකයන් හෝ දීමනා හෝ වෙනත් ගෙවීමක් නිශ්චය කිරීම සම්බන්ධව අවශ්‍ය වෙතැයි සැලකෙන නියෝග සෑදීමට අමාත්‍යවරයාට හැකිය. — පාරිශ්‍රමික හෝ දීමනා

31. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලබන ජාතික පුස්තකාල සේවා ප්‍රතිපත්තිවලට අනුකූලව දෙනු ලබන උපදෙස් සැලකිල්ලට ගැනීමත්, පුස්තකාල සේවා කටයුතුවල දී ශ්‍රී ලංකාව තුළ සමරූපී තත්වයකින් කටයුතු කිරීමටත් හැකිවන පරිදි ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නිර්දේශ හෝ නිරීක්ෂණ අවශ්‍ය අවස්ථාවන්හි දී ලබා ගැනීමත්, සමීප සහයෝගයකින් යුතුව කටයුතු කිරීමත් සිදු විය යුතු ය. — ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය හා බැඳීම

32. අර්ථ නිරූපනය

(අ) 1. පද සම්බන්ධයෙන් අර්ථකථනයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ "අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාත් සභාවේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා අදහස් වන අතර, අමාත්‍යාංශය යන්න ඒ අනුව තේරුම්ගත යුතු ය.

2. "ලේකම්" යනුවෙන් ඌව පළාත් සභාවේ අධ්‍යපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විය යුතු ය.

3. "පුස්තකාල විඥාපන හා ප්‍රලේඛන" යන්නට අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පුස්තකාල විඥාපන සහ ප්‍රලේඛන සේවා වශයෙන් පිළිගනු ලබන ඕනෑම ආකාරයකට පුස්තකාල සේවා, තොරතුරු සේවා අයත් වේ.

4. "පළාත් පාලන ආයතන සභාපතිවරු" යන්නට මහ නගර සභා නගරාධිපතින් ද ඇතුළත් වේ.

(ආ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන සඳහා ද, පුස්තකාල කටයුතු වලදී ද අවශ්‍ය වන හා භාවිත වන වගන්ති අර්ථ විග්‍රහය පහත සඳහන් අයුරු විය යුතු ය.

1. අන්තර් පුස්තකාල පිරුළු සේවා - දැනුම අඩංගු මාධ්‍යක් පුස්තකාලයකට බැහැර දීම, පුස්තකාලයක නොමැති පුස්තකාල ද්‍රව්‍යයන් තවත් පුස්තකාලයකින් ලබා ගැනීම හා ප්‍රාදේශීය, කලාපීය සහ අන්තර් ජාතික සංවිධාන විශේෂයන්ට සම්බන්ධිත පුස්තකාල හා ප්‍රලේඛණ මධ්‍යස්ථාන විසින් හුවමාරුව සඳහා දැනුම අඩංගු මාධ්‍ය ලබා ගැනීම.

2. ඒකාබද්ධ සූචිය - විවිධ පුස්තකාල විසින් ප්‍රතිග්‍රහනය කර සංවිධානය කරන ලද පුස්තකාල ද්‍රව්‍ය තැන්පත් වී ඇති ස්ථාන සඳහන් කරමින් සකස් කරන සූචිය වේ. එය කර්තෘ, ග්‍රන්ථනාම, විෂය, වශයෙන් සකස් කරන වර්ගීකෘත සූචියක් විය හැකිය.

3. ජංගම පුස්තකාල - පුස්තකාල ද්‍රව්‍ය තැන්පත් කර ගැනීමට හැකි වාහනයක් විශේෂයෙන් සකස් කර ගෙන එමගින් අනිකුත් ප්‍රදේශ සඳහා පුස්තකාල සේවා කටයුතු ව්‍යාප්ත කරලීම.

4. පුත්තකාලය/ප්‍රලේඛන මධ්‍යස්ථානය - විමර්ශන අංශය සඳහා පොත්පත් වාර සඟරා, ශ්‍රව්‍ය/දෘශ්‍ය මාධ්‍ය වැනි දැනුම අඩංගු මාධ්‍ය රැස්කර තබා ඇති ස්ථානයකි. අත් පිටපත්, දුර්ලභ ග්‍රන්ථ, පරිගණක මෘදුකාංග, ආදිය සංරක්ෂණය කර පාඨකයින්ට පරිශීලනය කිරීමට පුස්තකාලය විසින් පහසුකම් සැපයේ.
පොත්පත්, වාර සඟරා, ශ්‍රව්‍ය/දෘශ්‍ය මාධ්‍ය වැනි දැනුම අඩංගු මාධ්‍ය පදනම් කරගෙන නිකුත් කරන අනුක්‍රමණිකා, සාර සංග්‍රහ, නාමාවලි වැනි ද්විතීය මූලාශ්‍ර සම්පාදනය ප්‍රලේඛණ මධ්‍යස්ථාන මගින් සිදු වේ.

5. පුස්තකාල කමිටුව - පුස්තකාලයක් ආශ්‍රිතව උපදේශන සේවාවන් සහ කාර්ය සාධන ඉටු කර ගැනීමට සහාය වන ස්වේච්ඡා සංවිධාන විශේෂයකි.

6. පුස්තකාල අරමුදල - පළාත් සභා සහ ප්‍රාදේශීය මට්ටමේ සියලු වර්ගවල පුස්තකාලවලට සහාය වීම සහ සංවර්ධන කටයුතු සඳහා පිහිටුවා තිබෙන මධ්‍යගත අරමුදල.

7. පුස්තකාල සම්පත් - පාඨක විඥාපන අවශ්‍යතාවයන් සපුරාලීමට ඉවහල්වන මුද්‍රිත පොත්, වාර සඟරා, පුවත්පත්, ශ්‍රව්‍ය/දෘශ්‍ය, මාධ්‍ය, ශබ්ද තැටි, සූක්ෂම පටි, පරිගණක මෘදුකාංග, සිතියම්, අත්පිටපත්, පුස්තකාල පොත් යනාදිය දැනුම අඩංගු මාධ්‍ය පුස්තකාල සම්පත් ලෙස සැලකේ.

8. මධ්‍ය පුස්තකාලය - පළාතේ ප්‍රධාන පුස්තකාලය වන අතර එය පළාතේ සියලුදෙනාට පරිහරණය කළ හැකි පළාත් මධ්‍ය පුස්තකාලය වේ.

9. මධ්‍යගත සූචිකරණය - ප්‍රධාන පුස්තකාලයක් විසින් අනිකුත් පුස්තකාල සඳහා සූචි සංලේඛ සම්පාදනය කිරීම, මුද්‍රණය කර බෙදාහැරීම මෙමගින් සිදු වේ. සියලුම පුස්තකාල සූචිකරණ කටයුතුවල දී ඒකීයභාවයක් අපේක්ෂා කර ගැනීම මධ්‍යගත සූචිකරණය මගින් අපේක්ෂා කෙරේ.

10. සාමූහික ප්‍රතිග්‍රහණය - සියලු පුස්තකාල සඳහා එක් මධ්‍යගත ස්ථානයකින් පොත් ඇණවුම් කිරීම, පොත් මිලදී ගැනීම, තිළිණ ප්‍රදාන හා හුවමාරු යන මාධ්‍යයන්ගෙන් ලැබෙන පුස්තකාල ද්‍රව්‍ය ලබා ගැනීම, තාක්ෂණික කටයුතු කරලීම, අදාළ පුස්තකාලයට සංසරණය සඳහා යැවීම.

11. සංරක්ෂණය - පුස්තකාල ද්‍රව්‍ය දිගුකාලීන පැවැත්ම සඳහා කෙරෙන ප්‍රතිසංස්කරණය, ලැමිනේටින්, බැඳීම වැනි සංරක්ෂණ ක්‍රියාවලීන් ඉටුකිරීම පුස්තකාල ද්‍රව්‍යවල ඇති අන්තර්ගතය ස්වාභාවික හා භෞතික උවදුරුවලින් ආරක්ෂාකර ගැනීමට විධිමත් පියවර ගැනීම ද මෙයින් අදහස් වේ.

12. ව්‍යාප්ති සේවා - පුස්තකාල ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, වැඩ මුළු වැනි පාඨක සමාජ මගින් කටයුතු සංවිධානය කර පුස්තකාලය අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වශයෙන් විදහා දැක්වීමට ඉටු කරනු ලබන සේවාවන් මින් අදහස් වේ.

13. විඥාපන ජාල - භූගෝලීය/පරිපාලනමය/විෂය ක්ෂේත්‍රය මත පුස්තකාල කිහිපයක් සාමූහික ගිවිසුමක් මත එකතු වී තොරතුරු හුවමාරු කිරීමට කටයුතු කිරීම මින් අදහස් වේ.

(අ) මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධව අර්ථ නිරූපණයක දී හෝ වෙනයම් කරුණක දී හෝ එහි සිංහල පිටපත මූලික පිටපත ලෙස පිළිගත යුතු ය.

08 - 122/4

## ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2001 අංක 01 දරන ඌව පළාතේ, මඟී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් සම්මත කරන ලදුව 2001 දෙසැම්බර් මස 11 වැනි දින සිට ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති මෙම ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැන ගැනීම සඳහා මෙහි පළ කරමි.

ඩබ්ලිව්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා,
ලේකම්,
ඌව පළාතේ, පළාත් සභාව.

2012 ක් වූ ජූලි මස 05 වැනි දින,
බදුල්ල, රජවීදිය
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාත් සභාවේ වර්ෂ 2001 අංක 01 දරන මඟී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය**

ඌව පළාත ඇතුළත මඟී ප්‍රවාහන සේවාවන් ද, ඌව පළාතට අදාල වන ප්‍රමාණයට ඌව පළාත හා සම්බන්ධ වන අන්තර් පළාත් මඟී ප්‍රවාහන සේවාවන් ද, විධිමත් කිරීම හා එම කාර්යයට අනුෂංගික වන අනෙකුත් කාර්යයන් සඳහා ද, එකී විධිමත් කිරීමේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා ඌව පළාතට "මඟී ප්‍රවාහන සේවා අධිකාරිය" නමින් අධිකාරියක් ස්ථාපනය කිරීම සඳහා වන ප්‍රඥප්තියකි. පෙරවදන

ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාත් සභාවේ වර්ෂ 2001 අංක 01 දරන "මඟී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය" යන නමින් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයන් මගින් ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් නියම කරනු ලබන (මෙහි "මින් මතු නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන්නේ ය. ක්‍රියාත්මක කරන දිනය

### *1 වැනි කොටස*

*ඌව පළාත සඳහා මඟී ප්‍රවාහන සේවා අධිකාරයක් පිහිටුවීම*

3. මෙම ප්‍රඥප්තියේ මින් මතු "අධිකාරිය" යන නමින් සඳහන් කරනු ලබන ඌව පළාතේ මඟී ප්‍රවාහන සේවා අධිකාරිය යන නාමයෙන් හැඳින්වෙන පළාත් අධිකාරියක් පිහිටුවනු ලැබේ. අධිකාරිය

4. තුන්වෙනි වගන්තියේ සඳහන් නාමයෙන් අධිකාරිය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් නඩු පැවරීම ද, ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකිය.

5. අධිකාරිය විසන් සිය අභිමතය පරිදි, අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව එහි ප්‍රවාහන සේවාවන් විධිමත් කිරීමේ විෂයට අදාල කාර්යයන් හා බලතල පැවරීම, විමධ්‍යගත කිරීම සහ අධිකාරියේ උප කාර්යාල යෝග්‍ය ස්ථාන වල පිහිටුවා පවත්වාගෙන යාම කරනු ලැබිය හැකිය. උප කාර්යාල

6. (අ) අධිකාරියේ, අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් එකොලොස් දෙනෙකුගෙන් යුක්ත විය යුතු අතර, එයින් පස් දෙනකු අධිකාරියේ සංයුතිය

"නිල බලැති සාමාජිකයන් ද" හය දෙනකු "පත් කළ සාමාජිකයන් ද " විය යුත්තේ ය.

(ආ) අධිකාරියේ සියළු සාමාජිකයින්ගේ පත්වීම් ලිපි අමාත්‍යවරයාගේ අත්සනින් නිකුත් කළ යුතු වන්නේ ය. එවැනි සියළු පත්වීම් *ගැසට් පත්‍රයේ* පල කරනු ලැබිය යුත්තේ ය.

නිලබලැති සාමාජිකයින්

(ඇ) නිල බලයෙන් පත් කරනු ලබන අධිකාරියේ සාමාජිකයන් පහත සඳහන් අයවිය යුතු ය.

(1) මගී ප්‍රවාහන විෂයභාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ යෝග්‍ය යයි තමා සලකන්නේ නම් තමා වෙනුවට අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු ලේකම්වරයා විසින් නම් කරනු ලැබිය හැකිය.

(2) මගී ප්‍රවාහන විෂය භාර පළාත් අමාත්‍යාංශයේ සේවයේ නියුතු සහකාර ලේකම් තත්වයට නොඅඩු ඇමතිවරයා විසින් නම් කරනු ලැබිය යුතු නිලධාරියෙකු.

(3) මුදල් විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඔහුගේ අමාත්‍යාංශයේ ගණකාධිකාරි වරයෙකු

(4) ඌව පළාත භාර නියෝජ්‍ය පොලිස්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන සහකාර පොලිස් අධිකාරිවරයෙකු හෝ ඊට වඩා උසස් නිලධාරියෙකු.

(5) ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස් හෝ ඔහු විසින් නම් කරනු ලබන සහකාර පළාත් කොමසාරිස් වරයෙකු

පත් කළ සාමාජිකයින්

(ඉ) අධිකාරියේ "පත් කල සාමාජිකයින් " පහත සඳහන් අය විය යුතු ය.

(1) ප්‍රවාහනය, ආර්ථික විද්‍යාව, පරිපාලනය හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍ර වලින් එකක හෝ වැඩි ගණනක පුළුල් පළපුරුද්දක්, සුදුසුකම් හෝ හැකියාවක් දක්වා ඇත්තාවූ බවට අමාත්‍යවරයා සෑහීමකට පත් වන පුද්ගලයින් තිදෙනෙකු.

(2) ඌව පළාතේ මගීන් නියෝජනය කිරීම සඳහා අමාත්‍යවරයාගේ අභිමතය පරිදි තෝරාගනු ලබන තැනැත්තෙකු

(3) ඌව පළාතේ පෞද්ගලික බස් හිමියන් නියෝජනය කිරීම උදෙසා ඌව පළාත සඳහා වූ බස් හිමියන්ගේ සංගමයෙන් නම් කරනු ලබන තැනැත්තෙකු

(4) ඇමතිවරයාගේ අභිමතය පරිදි තීරණය කරනු ලබන පහත දැක්වෙන නිලධාරීන්ගෙන් එක් අයෙක්

(අ) (i) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපති විසින් නම් කරනු ලබන ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරිවරයකු නිල තත්වයට නොඅඩු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු හෝ ;

(ii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවට අනුප්‍රාප්තික වන ජාතික මට්ටමේ හෝ ප්‍රාදේශීය මට්ටමේ හෝ සංවිධානයක ප්‍රධානියා හෝ ප්‍රාදේශීය ප්‍රධානියා විසින් කරනු ලබන ඉහත (අ) (1) උප වගන්තියේ සඳහන් නිල තත්ත්වයට නොඅඩු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු හෝ,

(ආ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපති විසින් නම් කරනු ලබන සහකාර අධ්‍යක්ෂවරයෙකුගේ නිල තත්ත්වයට නොඅඩු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු,

අධිකාරියේ සභාපති

7\. (අ) අධිකාරියේ සාමාජිකයන් අතුරින් එක් තැනැත්තකු අධිකාරියේ සභාපති වශයෙන් ඇමතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

අධිකාරියේ විධායක බලය

(ආ) අධිකාරියේ විධායක බලය සභපතිවරයාට පැවරෙන්නේ ය. එකී බලය අධිකාරියේ එකඟත්වය ඇතිව සාමාන්‍යාධිකාරිවරයාට සහ ඔහු මගින් අධිකාරියේ අනෙකුත් නිලධාරීන්ට අවස්ථාවෝචිත පරිදි පවරා දෙනු ලැබිය හැකිය.

(ඇ) පවරා දෙනු ලැබ ඇති කිසියම් විධායක බලයක් හදිසි අවස්ථාවකදී තමා විසින්ම ක්‍රියාත්මක කරනු ලැබීමට සභාපතිට බාධාවක් නොමැති විය යුතු ය. — හදිසි අවස්ථා බලතල

8. යම් තැනැත්තෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභාවට මන්ත්‍රීවරයෙකු හෝ කිසියම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයෙකු වේ නම් හෝ, එවැන්නකු ලෙස පත්වේ නම්, හෝ ඒ තැනැත්තා අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ එවැනි සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට නුසුදුස්සකු වන්නේ ය. — සාමාජිකයෙකු වීමට නුසුදුසුකම්

9. යම් තැනැත්තෙකු අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට ප්‍රථම ඒ තැනැත්තා විසින් එකී අධිකාරියේ සාමාජිකයෙකු ලෙස ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම කෙරෙහි ප්‍රතිවරුද්ධ ලෙස බලපෑ හැකි මූල්‍යමය හෝ වෙනත් ආකාරයේ සම්බන්ධතා හෝ උනන්දු රජයට හෝ කිසියම් පළාත් සභාවකට හෝ පළාත් පාලන ආයතනයකට අදාලව ඔහු සතුව නොමැති බවට අමාත්‍යවරයා සෑහීමකට පත්විය යුතු ය. කිසියම් සාමාජිකයෙකු සතුව එවැනි සම්බන්ධතා හෝ උනන්දුවක් නොමැති බවට අමාත්‍යවරයා කලින් කල සෑහීමකට පත්විය යුතු ය. සාමාජිකයෙකු වශයෙන් ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ යම් තැනැත්තෙකු හෝ, සාමාජිකයෙකු වශයෙන් පත් කිරීමට අමාත්‍යවරයා අදහස් කරන යම් තැනැත්තෙකු හෝ, මෙම වගන්තිය යටතේ තමාගේ කාර්යභාරය ඉටු කිරීම සඳහා තමාට අවශ්‍ය යැයි අමාත්‍යවරයා සලකන තොරතුරු අමාත්‍යවරයාට සැපයිය යුතු වන්නේ ය. — අමාත්‍යවරයාට තොරතුරු සැපයීම

10. (1) අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ, ක්‍රියාත්මක කිරීමට අදහස් කරනු ලබන යම් කොන්ත්‍රාත්තුවකට සෘජුව හෝ වක්‍රව, කුමන ආකාරයක හෝ සම්බන්ධතාවක් ඇති අධිකාරියේ කුමන හෝ සාමාජිකයෙකු එම සම්බන්ධතාවය අධිකාරියේ ආසන්නතම රැස්වීමකදී අනාවරණය කළ යුතු අතර, එසේ අනාවරණය වූ කරුණු රැස්වීමේ වාර්තාවෙහි වාර්තා කළ යුතු වන්නේය. තව ද, එකී සම්බන්ධතාවයන් ඇති සාමාජිකයා එම කොන්ත්‍රාත්තුව පිළිබඳ කිසියම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු ය. — අධිකාරියේ කොන්ත්‍රාත්

(2) සිය නිල තත්ත්වයෙන් එකී කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කටයුතු කරන කිසියම් සාමාජිකයෙකුට ඉහත (1) වැනි උපවගන්තිය අදාල නොවිය යුතු ය.

11. මෙහි 12 වැනි වගන්තියට යටත්ව, පළාත් ප්‍රවාහන අධිකාරියේ සෑම පත්කළ සාමාජිකයෙකුගේම ධුර කාලය පත්වීම ක්‍රියාත්මක වූ දින සිට අවුරුදු 03ක් විය යුතු අතර, කාලය ඉකුත්වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙකු විය යුතු ය. — අධිකාරියේ සාමාජිකයින්ගේ ධුර කාලය

එසේ වුවද, අධිකාරියේ පත්කල සාමාජිකයෙකුගේ පුරප්පාඩුවකට පත් කරනු ලබන සාමාජිකයෙකු හෝ ඔහු කලින් ධුරයෙන් ඉල්ලා අස්වුව හොත් හෝ, ඉවත් කරනු ලැබුහොත් හෝ අන් ආකාරයකින් ධුරය හිස් කල හොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයේ ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු වන්නේ ය.

12. අධිකාරියේ යම් සාමාජිකයෙකු අමාත්‍යවරයා විසින් සිය අභිමතය පරිදි ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය. එවැනි ඉවත් කිරීමක් හැකිතාක් ඉක්මනින් රජයේ ගැසට් පත්‍රයේ පළකල යුතු ය. — අමාත්‍යවයා විසින් සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කිරීම

13. අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් අධිකාරියේ සභාපතිට හෝ සාමාජිකයෙකුට සිය තනතුරින් ඉල්ලා අස්විය හැකිය. — සාමාජිකයින් ඉල්ලා අස්වීම

14. අධිකාරියේ සාමාජිකයෙකු හෝ සභාපති ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනයම් කිසි හේතුවක් නිසා හෝ තාවකාලික සිය තනතුරේ කාර්යයන් ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවලදී මෙහි 6 වැනි වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු පත් කිරීමට අමාත්‍යවරයාට හැකි වන්නේ ය. — සාමාජිකයෙකු නොමැති වීම

15. ප්‍රවාහන අධිකාරියේ සාමාජිකයන්ට සහ සභාපතිට, ඌව පළාතේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික දීමනා හා වෙනත් ගෙවීම් අධිකාරියේ අරමුදලින් ගෙවිය හැකිය. — සාමාජිකයින්ට පාරිශ්‍රමික

විශේෂිත හෝ හදිසි අවස්ථාව

16. (අ) අමාත්‍යවරයා විසින් විශේෂිත හෝ හදිසි යැයි සලකනු ලබන අවස්ථාවන්හි අධිකාරිය සතු බලතල කිසිවක් හෝ සියල්ල අධිකාරියේ සභාපතිට පැවරීමේ නියෝගයක් කළ හැකි අතර, එවැනි පැවරීමක් ක්‍රියාත්මක විය යුතු කාල සීමාව ද එම නියෝගයේ නිශ්චිත විය යුතු ය.

(ආ) එවැනි නියෝගයක් ඊලඟට එළැඹෙන ආසන්නතම රැස්වීමක දී අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

රැස්වීම් වල මුලාසනය දැරීම

17. (1) අධිකාරියේ සභාපතිවරයා සෑම රැස්වීමකම මුලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයාට පැමිණ නොසිටිය හැකි වුව හොත් පැමිණ සිටින සාමාජිකයන් එම රැස්වීමේ මුලාසනය දැරීම සඳහා තමන් අතුරෙන් වැඩි ඡන්දයෙන් සාමාජිකයෙකු තෝරා ගත යුතු ය.

ගණ පූරණය

(2) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා අවශ්‍ය ගණ පූර්ණය සභාපති ද, ඇතුලුව මුළු සාමාජික සංඛ්‍යාවෙන් පුරප්පාඩු සාමාජික සංඛ්‍යාව හැර ඉතිරි සංඛ්‍යාවෙන් දෙකෙන් පංගුවට වැඩි විය යුතු ය.

තීරක ඡන්දය

(3) අධිකාරියේ කවර හෝ රැස්වීමක දී මුලාසනය දරන තැනැත්තාට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

රැස්වීම් වාර හා ක්‍රියා පරිපාටිය

(4) අධිකාරියේ රැස්විය යුතු වන වාර ගණන සහ සභා රැස්වීමේ පැවැත්වීමට හා අධිකාරිය හෝ සභාපතිට මෙම ප්‍රඥප්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබ ඇති අභියාචනා සලකා බැලීම ද ඇතුලුව රැස්වීම් වල කටයුතු කිරීම සම්බන්ධයෙන් වන ක්‍රියා පරිපාටිය අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකිය. තවද, යම් කරුණක් නිසා රැස්වන ලෙස අමාත්‍යවරයාගෙන් ලැබෙන නිවේදනයත් අනුව ද අධිකාරය රැස්විය යුතු වන්නේ ය.

අධිකාරියේ මුද්‍රාව

18. (1) අධිකාරියේ මුද්‍රාව සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය.

(2) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කර ගත හැකිය.

(3) අධිකාරියේ මුද්‍රාව එම අධිකාරියේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර ලේඛණයකට හෝ සාධන පත්‍රයකට හෝ තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණි සිටින බවට, සාක්ෂි වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනාම ඒ සාධන පත්‍රයේ හෝ ලේඛණය අත්සන් කළ යුතු ය.

## *II වැනි කොටස*

### *අධිකාරිය සතු බලතල, කාර්ය භාරයෙන් හා කාර්ය මණ්ඩලය*

බලතල හා කාර්යභාරය

19. කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම සඳහා ඇමතිවරයාගේ අභිමතය අනුව, අවශ්‍ය යැයි වරින් වර සලකන වෙනස් කිරීම් වලට යටත්ව පළාත් අධිකාරියට මතු දැක්වෙන බලතල හා කාර්යයන් පැවරෙන්නේ ය.

ප්‍රමිති විපරම් කිරීම

(අ) ඌව පළාත් ඇතුළත හා ඌව පළාත සම්බන්ධිතව මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් හා පිළිගත හැකි ගුණත්වයකින් යුතු බස් රථ සේවයක් පවතින්නේ ද යන වග පිළිබඳ පරීක්ෂාකාරී වීම හා සමීක්ෂණය කිම සහ එම් සේවාවන්ට අදාල ප්‍රමිතීන් නියම කිරීම.

කාල සටහන්

(ආ) බස් රථ ධාවනය සඳහා කාල සටහන් නියම කිරීම එම කාල සටහන් අනුව ධාවන කටයුතු කළ යුතු බවට, ධාවකයන්ට නියම කිරීම හා ධාවකයන් එම කාල සටහන අනුගමනය කරන්නේ ද යන වග පිළිබඳ අධික්ෂණය කිරීම හෝ කරවීම

(ඈ) වෙන් වෙන් ගාස්තු මත මගී ප්‍රවාහනය සඳහා බස් රථයක් යොදා ගැනීමට කිසියම් පුද්ගලයෙකුට බලය දෙන මගී සේවා අවසර පත්‍රයක් හෝ එවැනි වෙනත් අධිකාරයක් නිකුත් කිරීම, අළුත් කිරීම, සංශෝධනය කිරීම හා අවලංගු කිරීම පිළිබඳ රෙගුලාසි පැනවීම — *මගී සේවා අවසර පත් රෙගුලාසි*

(ඇ) (3) වැනි උප වගන්තියේ සඳහන් අවසර පත්‍ර හෝ වෙනත් අධිකාරිවලට අදාල වන කොන්දෙසි නියම කිරීම, අවසර පත්‍රලාභීන් හෝ ඔවුන්ගේ සේවකයින් එම කොන්දේසි පිළිපදින බවට අවලෝකනය කිරීම හා යම් වෙනත් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව එලෙස පිළිපැදීම ක්‍රියාත්මක කිරීම. — *කොන්දේසි*

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ යම් අරමුණක් සඳහා අවශ්‍ය වන්නා වූ තොරතුරු, හා වාර්තා අධිකාරය වෙත සපයන ලෙස මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නිතියක් යටතේ හෝ මගී සේවා අවසර පත්‍ර ලාභියකු වන තැනැත්තෙකුට හෝ වෙනත් තැනැත්තෙකුට නියම කිරීම. — *තොරතුරු සැපයීම්*

(ඊ) මගී සේවා අවසර පත්‍රවලට අදාල වන්නාවූ නිකුත් කිරීම්, අළුත් කිරීම්, සංශෝධනය කිරීම හා ඒවාට අදාල වෙනත් කාර්යයන් සඳහා අයකරනු ලැබිය යුතු ගාස්තු නියම කිරීම හා වරින් වර සංශෝධනය කිරීම. — *ගාස්තු*

(උ) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහන සේවයේ යොදවනු ලබන බස් රථයක ප්‍රදර්ශනය කළ යුතු ගමනාන්ත නාම පුවරු, සළකුණු හා සංකේත පිළිබඳ රෙගුලාසි පැනවීම. — *ගමනාන්ත නාම පුවරු ආදිය*

(ඌ) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහන සේවයේ යොදවනු ලබන බස්රථ වල රියදුරන් හා කොන්දොස්තරවරුන් විසින් රැගෙන යායුතු හා තබාගත යුතු ලියකියවිලි හා ඒවායේ සඳහන් කළ යුතු තොරතුරු නියම කිරීම. — *බස්රථයේ ලියකියවිලි*

(එ) මගී සේවා අවසර පත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහන සේවයේ යොදවනු ලබන බස් රථයක, අවසර පත්‍ර ලාභියා විසින් පවත්වා ගෙන යායුතු ගුණාත්මක බව හා යෝග්‍යතාවය පිළිබඳ ප්‍රමිත සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීම සහ එම නියමයන් උල්ලංඝනය කිරීම හෝ නොසලකා හැරීම වෙනුවෙන් ගතයුතු පියවර නියම කිරීම — *බස් රථයේ යෝග්‍යතාවය*

(ඒ) මගී සේවා අවසරපත්‍රයක අධිකාරිය යටතේ මගී ප්‍රවාහනයේ යොදවනු ලබන බස් රථයක සේවා ගමන් වාර සම්බන්ධයෙන් තබා ගත යුතු හෝ නඩත්තු කළයුතු වාර්තා නියම කිරීම. — *වාර්තා*

(ඔ) මෙම ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් දරන්නෙකු විසින් එකී අවසර පත්‍රයේ අධිකාරය යටතේ මගී ප්‍රවාහනයේ යොදවනු ලබන බස් රථයක රියදුරු හා කොන්දොස්තර ලෙස සේවයේ යොදවනු ලබන තැනැත්තන් සම්බන්ධයෙන් සහ එම තැනැත්තාගේ සේවය ආරම්භ කිරීමේ නිම කිරීමේ වේලාවන් හා ඔවුනට ලබා දෙන විවේක වේලාවන් සම්බිනධයෙන් ද වේතන දීමනා හෝ ගාස්තු සම්බන්ධයෙන් ද තබා ගත යුතු පවත්වාගෙන යා යුතු හෝ අධිකාරියට ඉදිරිපත් කළ යුතු වාර්තා නියම කිරීම.

(ඕ) ඌව පළාත තුළ ඇති සියලුම බස් නැවතුම් පොලවල් හා එහි පිහිටි ගොඩනැගිලි ඌව පළාතේ ප්‍රවාහන අධිකාරිය සතු වන්නේ ය. ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්ගේ නීත්‍යානුකූල අවසරයක් නොමැතිව කිසිම ඉදිකිරීමක් කළ නොහැකිය. එම බස් නැවතුම් පොල වල නාම ලේඛය උප ලේඛනය අංක 1 වශයෙන් මෙම ප්‍රඥප්තියේ අමුණා ඇත. ඌව පළාත තුළ බස් නැවතුම් පොලවල් හා මාර්ගස්ථ නැවතුම් ස්ථාන පිහිටුවීම, නඩත්තු කිරීම, සංවර්ධනය කිරීම, වෙනස් කිරීම සහ වසා දැමීම, ඒවායෙහි මගී ආවරණ හා වෙනත් ගොඩනැගිලි ඉදි කිරීම, එම ස්ථාන වලට ආරක්ෂාව සැපයීම, බස් නැවතුම් පල භූමියේ මායිම් තුළ ඇති හිස් ඉඩකඩ ප්‍රයෝජනයට ගැනීම සහ බස් නැවතුම් පොල වලට අවශ්‍ය උපයෝගිතා සේවා සැපයීම හා ඒවාට අනුශාංගික කරුණු පිළිබඳ අදාල වන කොන්දෙසි නියම කිරීම, අවසර දීම, සීමා කිරීම හා තහනම් පැනවීම් පිළිබඳ තීරණ ගැනීම. — *බස් නැවතුම් පලවල් හා මාර්ගස්ථ නැවතුම්*

බස් නැවතුම් පල වලදී ක්‍රියාත්මක කිරීම්

(ක) බස් නැවතුම් පොලවල බස් රථ ධාවන කළමනාකරණ කටයුතු, කාල සටහන් ක්‍රියාත්මක කිරීම, බස් ගමන් වාර ආරම්භ ස්ථාන නියම කිරීම, එකී කළමණාකරන කටයුතු සඳහා බස් නැවතුම් පොල ස්ථාන භාර නිලධාරීන්, වේලා සටහන් කරුවන් හා අවශ්‍ය අනෙකුත් කාර්ය මණ්ඩල යෙදවීම සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ බලතල කාර්යයන් හා වගකීම් නියම කිරීම සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම.

(ග) බස් නැවතුම් පොලවල ධාවන කළමණාකරණ කටයුතු භාර කාර්යය මණ්ඩලය විසින් පවත්වා ගෙන යා යුතු වාර්තා සහ ලිපි ලේඛන හා ඒවායේ සටහන් කළ යුතු තොරතුරු නියම කිරීම හා ඒවායේ ආරක්ෂාව පිළිබඳ විධාන දීම.

අනුග්‍රාහක ගාස්තු ක්‍රම

(ජ) අනුග්‍රාහක ගාස්තු මත බස්රථවල ගමන් කිරීමේ පහසුකම් සැලැස්වීමට යෝග්‍ය බස් මගී කාණ්ඩායම් හඳුනා ගැනීම හා අනුමත කිරීම සහ අධිකාරිය යෝග්‍ය යැයි සලකන ආකාරයට එවැනි අනුග්‍රාහක ගාස්තු ක්‍රම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදීම.

ධාවයකින්ට දිරි ගැන්වීම

(ට) පළාත තුළ අනාර්ථික බස් මාර්ගවල ප්‍රමාණවත් බස් සේවා සැපයීම සහතික කරනු වස් අවශ්‍ය අවස්ථාවල දී ධාවකයින්ට දිරි ගැන්වීමේ මූල්‍යාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(ඩ) බස් ධාවකයින්ට ණය පහසුකම් ස්වභාවයේ හෝ විශේෂඥ උපදෙස් වශයෙන් හෝ වෙනත් යෝග්‍ය ආකාරයේ ආධාර හා පහසුකම් සපයා දීමේ ක්‍රියා පරිපාටි සහ යෝජනා ක්‍රම හඳුන්වා දීම, එවැනි කිසියම් යෝජනා ක්‍රමයක් සඳහා ඌව පළාත් සභාවේ අරමුදල් හෝ ඊට අයවිය යුතු ආදායම් හෝ සම්බන්ධ වන කල්හි, අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ.

මගීන්ගේ දායකත්වය

(ණ) මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාවන් පාලනය කිරීම, විධිමත් කිරීම හා බස්රථ වල ගුණත්වය දියුණු කිරීම සඳහා මගීන්ගේ දායකත්වය වර්ධන කිරීම, හා ඒ සඳහා මගීන්ගේ සංගම් පිහිටුවීම එකී සංගම්වලට අදාලව රෙගුලාසි පැනවීම හා ඒවාට මාර්ගෝපදේශකත්වය සහ වෙනත් යෝග්‍ය යැයි සැළකෙන ආධාර ලබා දීමට විධිවිධාන යෙදීම.

නීති විරෝධි මගී ප්‍රවාහනය

(ත) (i) මෙම ප්‍රඥප්තියේ සලසා ඇති විධිවිධානවලට පටහැනිව කෙරෙන ක්‍රියා වැලැක්වීම සඳහා ගතුයුතු ක්‍රියා මාර්ග සහ පැනවිය යුතු දඬුවම් නියම කෙරෙන රෙගුලාසි පැනවීම.

(ii) ඌව පළාත් සීමාව තුළ මගී ප්‍රවාහනයට සම්බන්ධ නීති විරෝධි ක්‍රියාවන් සෙවීම, වැළැක්වීම හා ඒවාට විරුද්ධව ක්‍රියා කිරීම අරමුණු කොට හදිසි පරීක්ෂණ කණ්ඩායම් ස්ථාපනය කිරීම, හෝ ස්ථාපනය කිරවීම සහ එකී කණ්ඩායම් වල බලතල හා කාර්යයක් නියම කිරීම සහ ඒවාට අදාලව රෙගුලාසි පැනවීම.

රියදුරන් හා කොන්දොස්තර වරුන් සඳහා රෙගුලාසි

(ද) මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවයේ යොදවනු ලබන බස්රථවල සේවය කරන රියදුරන් හා කොන්දොස්තරවරුන්ට අදාලව,

(1) සේවා අයිතිවාසිකම් ;
(2) වෘත්තීමය කුසලතා, සුදුසුකම් හා යෝග්‍යතාව ;
(3) සේවයේ යෙදී සිටියදී පිළිපැදිය යුතු විනය හා ආචාරශීලී බව ;හා
(4) සේවයේ යෙදී සිටියදී පැළඳිය යුතු නිළ ඇඳුම්, ලංජන හෝ සංකේත, යන කරුණු පිළිබඳ රෙගුලාසි පැනවීම.

අන්තර් පළාත් බස් සේවාව

(න) අත්තර්පළාත් මගී ප්‍රවාහන සේවායේ යොදවනු ලබන බස් රථ සම්බන්ධයෙන් සේවා අවසර පත්‍ර නිකුත් කිරීම කාල සටහන් නියම කිරීම, විවිධ ගාස්තු අය කිරීම හා එවැනි බස් රථ පළාත තුළ ධාවනය කිරීම, හා පළාත තුළ බස් නැවතුම් පොල වලදී ක්‍රියාත්මක වීම පාලනය කිරීම යන කරුණු සඳහා රෙගුලාසි පැනවීම.

ගිවිසුම් හා කොන්ත්‍රාත්

(ප) අධිකාරියේ අරමුණු හා කාර්යභාරය ඉටු කර ගැනීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි රෙගුලාසි පැනවීම හා එම පරමාර්ථ සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන්

පිටත හෝ යම් තැනැත්තෙකු හෝ යම් ආයතනයක් සමග ගිවිසුම් හෝ කොන්ත්‍රාත් වලට පිවිසීම.

(බ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, බද්දට හෝ කුළියට ගැනීම, භාරයේ තබා ගැනීම, භාවිතා කිරීම සහ නියම කර ඇත්තාවූ යම් ක්‍රියාමාර්ගයකට අනුකූලව බැහැර කිරීම. දේපළ අත්කර ගැනීම

(ම) අධිකාරිය විසින් සපයනු ලබන යම් සේවාවක් පහසුකමක් හෝ දේපළක් වෙනුවෙන් ගාස්තු අය කිරීම. සේවා ගාස්තු

(ය) මුදල්මය වශයෙන් හෝ ද්‍රව්‍ය වශයෙන් හෝ ප්‍රදාන, පරිත්‍යාග සහනාධාර හෝ ත්‍යාග පිළිගැනීම හා ඒවා අධිකාරියේ අරමුණු සඳහා ප්‍රයෝජනයට ගැනීම. පරිත්‍යාග

(20) මෙම ප්‍රඥප්තිය යටතේ කුමන කරුණක් හෝ සම්බන්ධයෙන් අධිකාරිය විසින් සාදනු ලබන කිසියම් රෙගුලාසියක් අමාත්‍යවරයා විසින් සිය අනුමැතියෙන් පසු නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු අතර, එම රෙගුලාසි *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය. තවද, අමාත්‍යවරයා විසින් එම රෙගුලාසි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 45ක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. රෙගුලාසි ගැසට් පත්‍රයේ පළකල යුතුය.

(21) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව, අධිකාරිය කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කිරීම හා එම කාර්ය මණ්ඩලයට අදාලව මතු දැක්වෙන කාර්යයන් ඉටුකර ගැනීමට අධිකාරියට බලය ඇත. කාර්යල මණ්ඩලය පිළිබඳ බලතල

(1) අධ්‍යාපනික, වෘත්තීමය හා අනෙකුත් සුදුසුකම් සහ වේතන හා වැටුප් ප්‍රමාණයක් ද ඇතුලුව බඳවා ගැනීමේ පරිපාටිය නියම කිරීම.

(2) පත් කිරීම, උසස් කිරීම, වැටුප්, වේතන හා අනෙකුත් දීමනා සහ විනය දඬුවම් හා සේවය අහෝසි කිරීම ඇතුළු විනය පාලනය, සාමාන්‍ය හැසිරීම, නිවාඩු යනාදිය පිරිස් පාලනයට අදාළ නියමයන් පැනවීම.

(3) කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂම භාවය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රම ඇති කිරීම.

(4) අර්ථ සාධක අරමුදල් ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(5) සුභ සාධක පහසුකම් ක්‍රියාත්මක කිරීම.

(22) (1) ඉහත 22 ඡේදය යටතේ පනවා ඇති විධිවිධාන ප්‍රකාරව සේවකයන් අලුතින් බඳවා ගැනීමට ද, නව පත්වීම් හා තාවකාලික හෝ මුදා හැරීම් මත ද්විතිය පදනම පිට හෝ කොන්ත්‍රාත් පදනම පිට සේවයේ යෙදවීමට බලය

(2) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්, සේවකයින්, අදාල බලධාරීන්ගේ එකඟත්වය ඇතිව, ද්විතීයයනය හෝ කොන්ත්‍රාත් හෝ වෙනත් පදනමක් පිට තම සේවයට බඳවා ගැනීම සඳහා අධිකාරියට බලය ඇත්තේ ය.

(3) 2001 අංක 01 දරන ඌව පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යම් ගිවිසුමක් මත ප්‍රවාහන අධිකාරිය ක්‍රියාත්මක වන දිනය වන විට සතුටුදායක, අඛණ්ඩ සේවයක් ඉටු කරන සේවකයින්, ප්‍රවාහන අධිකාරිය පිහිටුවන අවස්ථාවේ දී අධිකාරිය විසින් නියම කරනු ලබන, බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සපුරාලන්නේ නම්. ඔවුන් අධිකාරියේ යම් තනතුරකට බඳවා ගැනීමට හැකිය. කෙසේ වෙතත්, අවම අධ්‍යාපන සුදුසුකම් නොමැති සේවකයින් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ එකඟත්වය මත පළමු වරට බඳවා ගැනීම සඳහා ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කළ හැකිය.

තාවකාලික මුදා හැරීම මත ද්විතීයනය පදනමේ සිටින කාර්ය මණ්ඩලය

(4) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියතු යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ද්විතීයනය පදනම පිට බඳවා ගනු ලබන අවස්ථාවක,

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවා නියුක්තිකයින්

(අ) ඔහු හෝ ඇය අධිකාරියේ කාර්ය මණ්ඩලටය පත් කරන ලද අවස්ථවේ දී, රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම් ද, එම තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් නම් ද, ඔහු/ඇය අධිකාරියේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටි කාලය තුළ දී රාජ්‍ය ප්‍රතිපත්තිමය වැටුප රහිතව දෙන ලද නිවාඩු පිට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රාජකාරි සඳහා නොපැමිණෙන ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව විශ්‍රාම වැටපු ව්‍යවස්ථා සංග්‍රහයේ 10(1) වැනි වගන්තිය අදාල විය යුතුය. තවද ඔහු/ඇය අධිකාරියේ සේවයේ නියුක්තව සිටින සෑම සම්පූර්ණ මාසයක් සඳහා ම ඔහුගේ/ඇයගේ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරෙහි ඔහුට/ඇයට ගෙවිය යුතු වැටුපෙන් 25%ක් නෙඉක්මවන මුදලක් අධිකාරියේ අරමුදලින් අවස්ථාවෝචිත පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා භාණ්ඩාගාරයට හෝ පළාත් සභාවේ අරමුදලට හෝ ගෙවනු ලැබිය යුතු ය.

රා. සේ. අ. අ. මත සිටින සේවා නියුක්තිකයන්

(ආ) ඔහු/ඇය අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරන ලද අවස්ථාවේ දී රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායකව සිටියේ නම් අධිකාරයට ඔහු/ඇය කරන සේවය රජයට හෝ පළාත් සභාවකට කරනු ලබන සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව රාජ්‍ය සේවා ආර්ථසාධක අරමුදලට ගෙවීමට ඔහු/ඇය යටත්වන දායක වන ඔහු/ඇය අධිකාරියේ සේවයේ නියුක්තව සිටින කාලය තුළ නොකඩවා ගෙවනු ලැබිය යුතු ය. තවද, ඔහු/ඇය වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට රජය හෝ පළාත් සභාව විසින් ගෙවනු ලැබිය යුතු දායක මුදලට සමාන මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ බැරට අධිකාරිය විසින් අධිකාරි අරමුදල් වලින් ඔහු/ඇය වෙනුවෙන් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියට ස්ථිර පදනමක් මත පත් කිරීම

(5) රාජ්‍ය සේවායේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු හෝ සේවකයෙක් අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන්ප ත් කරනු ලබන අවස්ථාවක,

(අ) ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවා වෘත්තිකයින්

(ආ) ඔහු/ඇය අධිකාරයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේ දී රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙහි ඔහු/ඇය නිත්‍ය තනතුරක් ස්ථිර හා විශ්‍රාම වැටුප් තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් වූයෙන් නම් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ දින සිට ඔහු/ඇය රාජ්‍ය සේවයෙක් හෝ පළාත් රාජ්‍ය සේවයේන විශ්‍රාම ගන්වනු ලැබූයේ යැයි සලකා ඔහුට/ඇයට විශ්‍රාම වැටුප් සංග්‍රහය යටතේ ගෙවනු ලැබිය යුතු ප්‍රදානයක් ලැබීමට සුදුසුකම් ලබන්නෙකු සේ සලකනු ලැබිය යුතු ය.

(ඇ) ඔහු/ඇය වයස නිසා හෝ සෞඛ්‍ය හේතුන් නිසා විශ්‍රාම ගැනීමක් හෝ අධිකාරිය දරන ලද තනතුරක් අහෝසි කිරීම නිසා හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා හෝ සේවය අවසන් කරනු ලැබුවහොත් මීස විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරණු ලැබිය හැකි එවැනි යම් ප්‍රදාන මුදල ඔහු/ඇයට ගෙවනු නොලැබිය යුතු ය.

අධිකාරියේ සේවයේ යෙදී සිටියදී මියයාම

(ඉ) අධිකාරියේ සේවයේ නියුක්ත කර ලැබ සිටින අතර තුර ඔහුගේ/ඇයගේ මරණය සිදුවුවහොත් හෝ අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීමට පූර්වාසන්නට ඔහුගේ/ඇයගේ මරණය සිදුවී නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ ඔහු/ඇය වෙනුවෙන් ගෙවිය හැකි වන්නාවූ, යම් ප්‍රදානයක් ද, අධිකාරියේ සේවය වෙනුවෙන් ගෙවිය හැකි වන යම් ප්‍රදානයක් ද, ඔහු/ඇය වෙනුවෙන් ගෙවනු ලැබිය හැකිය.

(ඊ) අධිකාරි කාර්ය මණ්ඩලයට ඔහු/ඇය ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේ දී ඔහු/ඇය රාජ්‍ය සේවා අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයෙකු ව සිටින්නේ නම්, ඔහු/ඇය සේවයෙන් පහ කිරීමෙන් තොරව, ආණ්ඩුවේ හෝ පළාත් සභාවේ කැමැත්ත ඇතිව, ගිවිසුම් අවසන් වීමෙන්, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අත්හරිනු ලැබූ ලෙස, ඒ ආඥා පනතේ කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය. — රා. සේ. අ. මත සිටින සේවා නියුක්තිකයන්

(6) යම් නිශ්චිත කාලයක් සඳහා රජයට හෝ පළාත් සභාවට සේවය කිරීමට එකඟවීමෙන් රජය හෝ පළාත් සභාව සමඟ ගිවිසුමකට එළඹ සිටින තැනැත්තෙකු අධිකාරියේ සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරන යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කරන කාර්යයන් සඳහා කරනු ලබන සේවයක් සේ සැලකිය යුතු ය. — අනිවාර්ය සේවාව

23. අධිකාරියේ සියළුම නිලධරයන් හෝ සේවකයන් දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. — අධිකාරියේ සේවා නියුක්තිකයන් රජයේ සේවකයන් ලෙස සැලකීම

24. අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පණතේ විධිවිධාන ඒ අනුව අර්ථනිරූපණය කළ යුතු ය. — අල්ලස් පනතේ පරමාර්ථ සඳහා අධිකාරිය උපලේඛනගත ආයතනයකි

25. (අ) අධිකාරිය විසින් 23 වැනි වගන්තිය යටතේ කාර්ය මණ්ඩලය බඳවා ගන්නා තෙක්, මගී ප්‍රවාහන විෂය භාර පළාත් අමාත්‍යාංශයට අනුයුක්ත පළාත් ප්‍රවාහන අධ්‍යක්ෂ අධිකාරියේ සාමාන්‍යාධිකාරී විය යුතු ය. — සාමාන්‍යාධිකාරී අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියාය

(ආ) 7(ආ) උප වගන්තිය පරිදි විධායක බලය පවරනු ලබන සාමාන්‍යාධිකාරී වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරිවරයා විය යුතු ය.

26. අධිකාරියේ පොදු ප්‍රතිපත්තිමය, විධානයන්ට යටත්ව, අධිකාරියේ එදිනෙදා කටයුතු මෙහෙය වීම ද, අධිකාරියේ සේවා නියුක්තයන් පිළිබඳ සාමාන්‍ය විනය පාලක ඇතුළු පරිපාලනමය කාර්යයන් ද, අධිකාරිය මුල්‍ය පාලනය පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය ද, වෙනුවෙන් වගකීම් සාමාන්‍යාධිකාරිවරයාට පැවරෙන්නේ ය. — සාමාන්‍යාධිකාරී වරයාගේ පොදු වගකීම

27. රෙගුලාසි සෑදීමේ බලතල හැර මේ ප්‍රඥප්තියෙන් අධිකාරියට බලය පැවරෙන යම් බලතල හා කාර්තව්‍යයන් අතුරෙන් කාර්යක්ෂම පාලනයට අවශ්‍ය යැයි අධිකාරිය අදහස් කරන යම් බලතල හා කර්තව්‍යයන් අධිකාරිය විසින් සාමාන්‍යාධිකාරී වරයාට හා අනෙකුත් නිලධාරීන්ට පවරා දිය හැකිය. සාමාන්‍යාධිකාරී වරයා සහ අනෙකුත් නිලධාරීන් එවැනි බලතල හා කර්තව්‍යයන් අධිකාරිය මඟ පෙන්වීම හා අධික්ෂණය යටතේ ක්‍රියාත්මක කල යුතු අතර, එවැනි මඟ පෙන්වීම් හා අධීක්ෂණයෙන් අධිකාරිය වෙනුවෙන් එහි සභාපතිවරයා හෝ 7(ආ) වගන්තිය වැනි උප වගන්තිය යටතේ බලය පවරනු ලබන අනෙකුත් නිලධාරීන් විසින් ලබා දිය හැකිය. — සාමාන්‍යාධිකාරී වරයාගේ පැවරීම

28. සාමාන්‍යාධිකාරිවරයාගේ බලතල හා කර්තව්‍යයන් අතුරෙන් ඔහු අවශ්‍ය යැයි සලකන පරිදි, යම් බලතල හා කර්තව්‍යයන් සභාපතිගේ එකඟත්වය ඇතිව අධිකාරියේ සාමාන්‍යාධිකාරී වරයාට හා වෙනත් යම් සුදුසු සේවා නියුක්තිකයෙකුට ලිඛිතව පැවරිය හැකි විය යුතු අතර, සහකාර සාමාන්‍යාධිකාරීවරයා සහ/හෝ එවන් සේවා නියුක්තිකයෙකු විසින් එවන් බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍යයන් ඉටු කිරීම සාමාන්‍යාධිකාරී වරයාගේ අධීක්ෂණය හා විධානයන් යටතේ කළ යුතු ය. — සාමාන්‍යාධිකාරී විසින් පැවරීම

29. (අ) මෙම ප්‍රඥප්තිය හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ රීතියක හෝ නියෝගයට විධිවිධාන යටතේ හෝ යම් විධිවිධානයක් ප්‍රකාර තමා වෙත නතු වූ හෝ පැවරුන යම් කාර්යයක් කිරීමේ දී හෝ යම් අධිකාරියක් ක්‍රියාවේ යෙදවීමේ දී මෙම අධිකාරියේ යම් නිලධාරියෙකුට හෝ නිලධාරියෙකුට ඕනෑකමින් බාධා පමුණුවන කවරෙකු හෝ වරදකට වරද කරුවෙකු වන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වන ලද ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් 2,000කට නොවැඩි දඩයක් හෝ — අධිකාරියට බාධා කිරීම බලපෑම් කිරීම

අවුරුද්දකට නොවැඩි බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දඬුවමකට ඔහු යටත් විය යුතු ය.

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පණවනු ලබන අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝගයක් කඩ කිරීම වරදක් වන අතර, ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු, වරදකරු කරනු ලැබූ විට රු. 2,000කට නොවැඩි දඩයක් හෝ මාස 12කට නොවැඩි බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දඬුවමකට හෝ යටත්විය යුතු ය.

## *III වැනි කොටස*

### *මුදල්*

අධිකාරියේ අරමුදලට බැර

30. අධිකාරියට ඊටම අයත් අරමුදලක් තිබිය යුතු ය.

31. පහත දැක්වෙන මුදල් අධිකාරියේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(1) අධිකාරිය විසින් සිය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම මගින් ලැබෙන, එක්රැස් කරනු ලබන හෝ අයකරනු ලබන සියළු මුදල්

(2) ඌව පළාත් සභාව විසින් වෙන් කර දෙනු ලබන සියළු මුදල්

(3) කුමන හෝ මූලාශ්‍රයකින් අධිකාරියට ගාස්තු, ආධාර, පරිත්‍යාග, ප්‍රදාන හා ණය වශයෙන් ලැබෙන සියළු මුදල්

ලැබීම් හා ගෙවීම් පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය

32. අධිකාරියේ අරමුදලට ලැබීම් ද, ඉන් මුදල් ගෙවීම් ද පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය පිළිබඳ වගකීම් සාමාන්‍යාධිකාරිවරයාට පැවරෙන්නේ ය.

අධිකාරිය විසින් අරමුදල් උපයෝගී කර ගැනීම

33. අධිකාරියේ කටයුතු කළමනාකරනය කිරීම වෙනුවෙන් දරන වියදම් සඳහා ද අධිකාරියේ සාමාජිකයින්ට සහ සේවා නියුක්තිකයන්ට පාරිශ්‍රමික දීමනා සහ අනෙකුත් සෑම ආකාරයකම ගෙවීම් කිරීම සඳහා ද මෙම ප්‍රඥප්තිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ද මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීම හා පවත්වාගෙන යාමට සම්බන්ධ සියළු කටයුතු සඳහා ද බස් නැවතුම්පලවල් හා මගී ආවරණ ඉදිකිරීම්, සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම හා ඊට අදාළ වන්නාවූ කරුණු සඳහා ද, අමාත්‍ය මණ්ඩලය විසින් වරින් වර අනුමත කරනු ලබන වෙනත් පරමාර්ථ සඳහා ද අධිකාරියට, අධිකාරියේ අරමුදල් උපයෝගි කර ගත හැකි විය යුත්තේ ය.

අධිකාරිය විසින් ණය ගැනීම

34. අධිකාරියේ නිශ්චිත පරමාර්ථ සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය සහිතව ණය මුදල් වශයෙන් මුදල් ලබා ගැනීමට අධිකාරියට බලය ඇති අතර, ණය මුදල් ප්‍රමාණය, ආපසු ගෙවීම් කාල සීමාව, ණය පාලනය වන කොන්දේසි හා ණය ලබා ගැනීමට අපේක්ෂිත ආයතනය පළාත් අමාත්‍ය මණ්ඩලය තීරණය කරන පරිදි විය යුතු ය.

මුදල් වර්ෂය

35. අධිකාරියේ මුදල් වර්ෂය. ලිත් වර්ෂය විය යුතු ය.

අධිකාරියේ ගිණුම් විගණනය

36. අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ සියළු මුල්‍යමය ගණුදෙනු හා ඊට අදාළ ගිණුම් කාර්ය පටිපාටි සම්බන්ධයෙන් ඌව පළාතේ, පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් කලින් කල විගණනය කරනු ලැබිය යුතු ය.

සාමාන්‍යාධිකාරිවරයා හා පළාත් ප්‍රවාහන අධ්‍යක්ෂවරයා

37. මෙම ප්‍රඥප්තියේ 26 වැනි වගන්තිය යටතේ පත්කරනු ලබන අධිකාරියේ සාමාන්‍යාධිකාරි වරයා, අනාගතයේ දී වෙනත් නියමයන් කරනු ලබන තෙක්, මෙම ප්‍රඥප්තියේ පරමාර්ථ උදෙසා, ඌව පළාතේ "පළාත් ප්‍රවාහන අධ්‍යක්ෂවරයා" වන්නේ ය.

38. අධිකාරිය ක්‍රියාත්මක වන දිනයේ, ඌව පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන විෂයභාර අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශයේ සේවයේ නියුක්ත නිලධාරීන් හා සේවකයින්, එදින සිට ඔවුන්ගේ එකඟත්වය ඇතිව, අධිකාරියේ නිලධාරීන් හා සේවකයින් වශයෙන් සලකනු ලැබිය හැකිය. ඔවුන් පළාත් රාජ්‍ය සේවයෙන් තාවකාලිකව මුදාහැරීම පිට අධිකාරියේ සේවය සඳහා, එකී දින සිට ද්විතීයනය කළ සේ සැළකිය යුතු අතර, මෙම ප්‍රඥප්තියේ 23 වැනි වගන්තිය ඔවුනට අදාල විය යුතු ය.

සේවයේ නියුතු නිලධාරීන් තාවකාලිකව මුදා හැරිය ලෙස සැළකිය යුතුවේ.

39. මෙම ප්‍රඥප්තිය අනුව අධිකාරියට පැවරී ඇති බලතල හා කාර්යයන්ට අදාලව මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙර ඌව පළාතේ ප්‍රවාහන අධ්‍යක්ෂ විසින් ඇතිකර ගනු ලැබූ යම් ගිවිසුමක් වේ නම් මෙම අධිකාරිය ක්‍රියාත්මක වන දිනයේ සිට ඒ සියළු ගිවිසුම් බල රහිත වූවා සේ සලකනු ලැබිය යුතු ය.

ප්‍රවාහන අධ්‍යක්ෂ විසින් ඇති කරගෙන ඇති ගිවිසුම්

40. මගී ප්‍රවාහන විෂය භාර පළාත් අමාත්‍යාංශය විසින් පාලනය කරනු ලබන අංක 10166 දරන ගමනා ගමන ක්‍රියාකාරී මණ්ඩලයේ ගිණුම බැරකම් පියවීමෙන් පසු එකී ගිණුමේ ශේෂය අධිකාරියට මාරු කරනු ලැබිය යුතු අතර, එය අධිකාරියේ අරමුදලේ කොටසක් විය යුත්තේ ය.

ප්‍රවාහන ගිණුම

41. (1) ඌව පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව හා ඌව පළාතේ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් වෙනත් අයුරකින් තීරණය කරනු ලබන තෙක්, ද්විතීයන පදනම පිට අධිකාරියේ සේවයේ යොදවනු ලබන කාර්යය මණ්ඩලයට නියමිත පෞද්ගලික පඩි නඩි, දීමනා හා අනෙකුත් ගෙවීම්, මගී ප්‍රවාහන සේවා විෂයභාර පළාත් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන වලින් ගෙවනු ලැබිය යුතු ය.

ද්විතියනය කළ නිලධාරීන්ට වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම්

(2) ඌව පළාතේ ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව හා ඌව පළාතේ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් වෙනත් අයුරකින් තීරණය කරනු ලබන තෙක්, ඉහත (1) වැනි උප වගන්තියේ සඳහන් කාර්යය මණ්ඩලය හැරුනු විට, අනෙකුත් සේවා නියුක්තිකයන්ට නියමිත වේතන, දීමනා හා වෙනත් ගෙවීම් ඉහත 40 වැනි වගන්තියේ සඳහන් ගිණුමේ මුදලින් ගෙවනු ලැබිය යුතු වේ.

අනෙකුත් කාර්ය මණ්ඩලයට ගෙවීම්

42. ඌව පළාතේ මුදල් විෂය භාර අමාත්‍යවරයා ද විමසා අමාත්‍යවරයා වෙනත් අයුරකින් තීරණය කරන තෙක්, 41 වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව, මෙම ප්‍රඥප්තියේ ඕනෑම පරමාර්ථයක් සඳහා අධිකාරය විසින් එකී ප්‍රවාහන ගිණුමේ මුදල් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකිය.

අධිකාරිය විසින් ප්‍රවාහන අත්තිකාරම් ගිණුමේ මුදල් භාවිතා කරනු ලැබිය හැකිය.

43. අධිකාරිය විසින් වෙනත් අයුරකින් තීරනය කරන තෙක්, මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මීට පෙර සකස් කරනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝග වලංගු නියෝග ලෙස සළකනු ලැබිය යුත්තේ ය.

ප්‍රඥප්තිය යටතේ රෙගුලාසි (නියෝග)

44. මෙම ප්‍රඥප්තිය සිංහල හා ඉංග්‍රීසි, දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

45. අර්ථ නිරූපනය :

"අධිකාරිය" "පළාත් අධිකාරිය" යන වචන වලින් "ඌව පළාතේ මගී ප්‍රවාහන සේවා අධිකාරිය" අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ මගී ප්‍රවාහන සේවා විෂයභාර අමාත්‍යවරයා අදහස් වන්නේ ය.

"අමාත්‍ය මණ්ඩලය " යන්නෙන් ඌව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය අදහස් වේ.

"පළාත" යන වචනයෙන් ඌව පළාත අදහස් වන්නේ ය.

"අවසර පත්‍රය" "මගී සේවා අවසර පත්‍රය" "මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රය" "මාර්ග බලපත්‍රය" යන නම් වලින් කුමන හෝ නමකින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ විවිධ ගාස්තු මත අවසර පත්‍රයේ දක්වා ඇති මාර්ග මගීන්

ප්‍රවාහන කිරීමට බස් රථයක් යොදා ගැනීම සඳහා බලය දෙමින් නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් අදහස් වන්නේ ය. "බස් නැවතුම් පොල" යන වචනයේ අදහස් තුළ මහ මග දෙපස බස් නවත්වන ස්ථාන ද ඇතුළත් විය යුත්තේ ය.

"ගැසට් පත්‍රය" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අදහස් වන්නේ "පළාත් පාලන ආයතන" යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන්නේ ය.

08 - 122/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.